දිට්ඨන්තරත්නාවලී

දිඨ්ඨානරතනාවලී.

විදුරුපොල සුමඞ්ගලාරාම විහාරාධිපති

උඩරට අමරපුරනිකායේ මහානායක ධුරන්ධර

අතිගරු පූජ්‍ය පණ්ඩිත

විදුරුපොල පියතිස්සාභිධාන

මහාස්ථවිර පාදයන් වහන්සේ විසින්

සිංහල භාවසන්න සහිතව රචනාකරණලදි.

කොළඹ

ජූ. පී. ඒකනායක සහ සමාගම විසින්

ශ්‍රී භාරතී යන්ත්‍රාලයෙහි

මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරණලදි.

බු. ව. 2469.

ක්‍රි. ව. 1926.

DITTHANTARATANAWALI.

COMPOSED AND TRANSLATED

INTO SINHALESE

BY

The Right Revd: Pandit Widurupola Piyatissa

Maha Nayaka Thera

OF UPCOUNTRY AMARAPURA SECT.

CEYLON.

(The Author of Maha Kassapa Carita &c.)

PRINTED AND PUBLISHED BY

Messrs, U. P. EKANAYAKA & Co.

AT THE

SRI BHARATI PRESS,

COLOMBO.

B. E. 2469.

C. E. 1926.

ත්‍රිපිටකමුද්‍රණසභාවේ අධ්‍යක්‍ෂධුරන්ධර

වෛද්‍යාචාර්ය්‍ය

සී. ඒ. හේවාවිතාරණ මැතිතුමාණන්ට

පිළිගන්වනලදී.

TO

Dr. C. A. HEWAVITARANE

THE DIRECTOR OF

THRIPITAKA PUBLICATION COMMITTEE

OF THE

SIMON HEWAVITARANE BEQUEST.

සංඥාපනය.

දිට්ඨන්තරතනාවලි නම්වූ මෙම ශුද්ධමාගධී (පාළි) භාෂාමය පද්‍යප්‍රබන්ධය ශ්‍රී **කුසුමදෙව** මහාචාර්‍ය්‍යයන්ගේ **දෘෂ්ටාන්තශතක** ප්‍රකරණය හා සම්වූ කෘතියකි. මෙහි රචනාක්‍රමය නම් පද්‍යයාගේ පූර්වාර්ධයෙන් කියනුලබනකරුණට සුදුසුනිදසුනක් එහි අපරාර්ධයෙන් දක්වීමයි. දෘෂ්ටාන්ත ශතකයට වඩා මෙහි වෙනස්වූයේ පාළිභාෂාව සහ ගාථාසංඛ්‍යාව වැඩිම පමණෙකි.

මෙහි ගාථා යෙළසියයක් මා විසින් පළමුවරට ලියා තුබුණේය. අවුරුදු කීපයකට පෙර පැවති **සිරිසරසහරා** නම්වූ ප්‍රයොජනවත් ශාස්ත්‍රීය සඟරාවෙහි මෙසින් ගාථා බොහොමයක් සිංහලභාවය සහිතව පළකරවීමි. ඒ දැක හිතවත් බොහෝ දෙනෙක්ම ඒ ගැණ සතුට ප්‍රකාශකර එවූබැවින් මෑතදී තවත් ගාථා සියයක් ඊට ඇතුලත්කොට ගාථා දෙසිය පණසකින් පොත නිමවා සිංහල භාවය සහිතවූ මේ පොත පළමුවරට මුද්‍රණය කරවීමේ බලය කොළඹ **යූ. පී. ඒකනායක සහ සමාගමේ** මහතුන්ට පැවරුවෙමි. ලොකශාසනොපකාරිවූ ඒ සද්ගුණවත් බෞද්ධ මහතුන් මෙම කටයුත්ත ඉටුකිරීමට සතුටුවීම ගැණ මගේ දයාබර සතුතිය පුදකරමි.

මේ මාගධී භාෂාමය පද්‍ය ප්‍රබන්ධය ස්වර්ගීතවූ **සයිමන් හේවාවිතාරණ** මහතාණන්ගේ ධනව්‍යයෙන් පිහිටුවනලද **ත්‍රිපිටක මුද්‍රණසභාවේ අධ්‍යක්‍ෂ තැන්පත් වෛද්‍යාචාර්‍ය්‍ය සී. ඒ. හේවාවිතාරණ** මැතිතුමාණන්ට පිළිගන්වන ලද්දේ එතුමා විසින් ශුද්ධමාගධීභාෂාවගේත් සම්බුද්ධධර්මයාගේත් චිරස්ථිතියපිණිස ඉටුකරණුලබන උසස්මෙහෙය ගැණ මගේ කෘතඥභාවය පෙන්වීමක් වශයෙනි. මෙය ආදර කරුණා පෙරදැරිව පිළිගැණීම ගැණ එතුමාට පසසමි.

මේවගට,

විදුරුපොල මහානායකස්ථවිර.

2469

1926–2–25.

අභිනවාරාමවිහාරය,
නුවරඑළිය.

භාවසන්නසහිත

දිට්ඨන්තරතනාවලිය.

නමො තස්ස භගවතො අරහතො
සම්මා සම්බුද්ධස්ස.

1 දිට්ඨන්තං ඤෙය්‍යධම්මාන-
මදිට්ඨන්තඤ්ච කෙනචි,
දිට්ඨන්තං සමතික්කන්තං
වන්දිත්වා ලොකනායකං.

2 චිරන්තනවිභාවිතං
භාරතීපථ'මාසිතො,
රචයිස්සාමි නාමෙන
දිට්ඨන්තරතනාවලිං.

භාවය. සංස්කාර විකාර ලක්‍ෂණ නිර්‍වාණ ප්‍රඥප්ති සඞ්ඛ්‍යාතවූ සකලඥෙයධර්මයන් සම්බන්ධව දක්නාලද කෙළවර ඇත්තාවූ හෙවත් සියලු දතයුතු ධර්මයන් අවසන්කොට දැන වදාළාවූ, රූපකාය ධර්මකාය සම්පත් දෙකින්ම අචින්ත්‍යවත බැවින් ලොව කිසිවකු විසින් නොදක්නාලද ගුණ කෙළවර ඇත්තාවූ, දෘෂ්ට්‍යන්තය හෙවත් ශාස්වත උච්ඡෙද විසින් විවිධවූ ලාමක දෘෂ්ටිය ඉක්ම (මැදුම් පිළිවෙතින් නිවණට) ගියාවූ, ලොකස්වාමිවූ භාග්‍යවතුන් වහන්සේ අපමණ සැදැහැ බැතිපෙම් වඩා කාවිසිමූති තුන්දෛරින් සකසා වැඳ පුරාතන පණ්ඩිතොත්තමයන්ගේ වාග්මාර්ගය ඇසුරු කොළෙම් දෘෂ්ටාන්ත (උදහරණ) නමැති මහාර්ඝ රත්නයන් අවුණා කළ රුවන් වැලක් වැනි හෙයින් අන්වර්ථ නාම වශයෙන් **දිට්ඨන්තරතනාවලී** නම්වූ මාගධී භාෂාමය පද්‍ය ප්‍රකරණයක් රචනා කරන්නෙමි.

3 භගවායෙව සබ්බසං
භවදුක්ඛවිනාසකො,
වාරිදො ඝොරදාවග්ගිං
නිබ්බාපයිතු'මිස්සතෙ.

භා. භාග්‍යවතුන් වහන්සේම සියලු සත්ත්වයන්ගේ සංසාර දුඃඛය නසනසේක. එයට දෘෂ්ටාන්ත කවරේදයත්? මෙසඟ තෙමේම දරුණු ලැව්ගිනි නිවීමට සමර්ථවේ. යනුයි.

4 ස්වාඛ්‍යාතො මුනිනා ධම්මො
මහාමොහතමොනුදෙ,
අන්ධනතමනුදෙ එකො
චක්කවාළස්ස භානුමා

භා. සර්වඥයන් වහන්සේ විසින් ආදි කල්‍යාණාදි වශයෙන් මනාසේ වදාරණලද ශ්‍රී සද්ධර්මයම සියලු සත්ත්වයන්ගේ මහා අවිද්‍යාන්ධකාරය දුරුකරන්නේවෙයි. ඒ එසේමය. එක සූර්‍ය්‍ය දිව්‍යරාජ තෙමේම සක්වළ මුළුල්ල පැතිර සිටිනා දිවාගනඳුර දුරුකරන්නේයි.

5 ජනස්සා'රියසංඝො'ව
භූරිපුඤ්ඤවිපාකදෙ,
සුඛෙත්තෙ රොපිතංයෙව
බීජං හොති මහප්ඵලං.

භා. සර්වඥ පුත්‍රවූ අෂ්ටාර්‍ය්‍ය සංඝතෙමේම මහාජනයාහට බොහෝවූ කුශල විපාකය ගෙණදෙන සේක. 'සරුකෙතෙහි වපුළාවූ බිජුවටම මහත්වූ ශස්‍යඵලය ඇත්තේවෙයි.

6 ගුණං තිබිල'මෙතෙ'ව
විජ්ජතෙ රතනත්තයෙ,
අනග්ඝමණිසඞ්ඝාතො
විජ්ජතෙ'ව මහණ්ණවෙ.

භා. සියලු ගුණය මේ තුනුරුවනෙහිම ඇත්තේය. අගය නොකළහැකි මිණිරුවන් රැස මහා සමුද්‍රයෙහිම විද්‍යමානවේ.

7 ලෙසම්පි තීසු වත්ථුසු
කතං කාරං මහප්ඵලං,
සිඞ්ඝමත්තබීජෙන
ජායතෙ වටපාදපො.

භා. තුනුරුවන් විෂයෙහි කරණලද මඳසත්කාරයද මහත් ඵලවෙයි. අබ ඇටක් පමණවූ බිජුවටිනුදු මහත් නුගරුකෙක් හටගණියි.

8 සබ්බකාමදදං හොති
ජන්තූනං රතනත්තයං,
කප්පරුක්ඛො හි දෙවාන-
මිච්ඡිතත්ථප්පදායකො.

භා. රත්නත්‍රය සත්ත්වයන්ට සියලු කැමති සැපත් ගෙණ දෙන්නේය. ඒ එසේමැයි. කප්රුක තෙමේ දෙවියන්හට ඉෂ්ටාර්ථ දායකවෙයි.

9 පවීණො ඛලු සන්තො'ව
හොති සගුණවණ්ණනෙ,
සහකාරඞ්කුරස්සාද-
කුසලො කිල කොකිලො.

භා. සත්පුරුෂයෙක්ම සද්ගුණයක් වර්ණනා කිරීමෙහි ඒකාන්තයෙන් දක්ෂවෙයි. මීඅඹ දළු රස විදීමෙහි දක්ෂවන්නේ කොවුල් පක්ෂි තෙමේමය.

10 දුජ්ජනො පන දූසෙති
ඛණෙන සගුණසංහතිං,
මලිනීකුරුතෙ ධූමො
සබ්බථා විමලම්බරං.

භා. දුර්ජන තෙමේ ඇසිල්ලකදී සද්ගුණ රාශියක් දූෂ්‍ය කරයි. ධූමය (දුම) පිරිසිදුවූ අහස හැමලෙසින්ම කිලිටු කරයි.

11 න කස්සචි විභාතී'හ
යථා දොසො තථා ගුණො,
කලඞ්කොයෙව චන්දස්ස
ඛ්‍යාතො නහි පසන්නතා.

භා. මේ ලොකයෙහි කිසිවකුගේ දොෂය මෙන් ගුණය පහළනොවෙයි. චන්ද්‍රයාගේ සසලපයම (බොහෝ දෙනා අතර) ප්‍රසිද්ධය. ප්‍රසන්නභාවය එසේ ප්‍රසිද්ධ නොවේමය.

12 සාධවොයෙව සාධූනං
විත්ථාරෙන්ති'ඛිලෙ ගුණෙ,
තනොති කුසුමාමොදං
දිසාසු සිසිරානිලො.

භා. සත්පුරුෂයෝම සාධූන්ගේ සියලු ගුණ විස්තරකොට කියති. සිහිල් පවන තෙමේ පුෂ්පයන්ගේ මිහිරි සුවඳ හැම දිශාවන්හි පතුරුවා හරියි.

13 ගුණාන'මන්තරං භියො
ගුණී ජානාති නෙ'තරෙ,
ජානාති මල්ලිකාමොදං
ඝාණ'මෙව න ලොචනං.

භා. ගුණයන්ගේ එකකට එකක ඇති වෙනස බොහෝසේ ගුණවතෙක් මිස අනෙකෙක් නොදනියි. බොලිද්ද මලෙහි සුවඳ නාසයම මුත් ඇස නොදන්නේයි.

14 පාසංසියො ගුණෙනෙ'ව
න රූපෙන යුතො ක්වචි,
සුගන්ධහීනං කුසුමං
රුචිරම්පි න ගය්හතෙ.

භා. ගුණයෙන්ම මිස හුදෙක් රූපයෙන් යුක්තවූයේ කිසිතැනෙකත් පැසසියයුතු නොවන්නේය. සුවඳ නැති මල සිත්කළුවූවත් නොගන්නාලැබේ.

15 ගුණෙ පූජෙන්ති ජන්තුනං
න ජාතිං යෙව කෙවලං,
ඵලිකං භාජනං භින්නං
කාකිණ්‍යා'පි න කියතෙ.

භා. (ලෝවැස්සෝ) සත්වයන්ගේ ගුණයන් මිස ජාතිය පමණක් නොපුදති. බිඳුනාවූ පිළිමිණි බඳුන තුට්ටුවකටවත් විකොටගණු නොලැබේ.

16 කුද්ධාන'මපි සාධුන-
මක්ඛුබ්භො න භවෙ මනො,
සන්තාපිතුං තිණුක්කාය
නහි සක්කා මහොදධිං.

භා. කිපුණාවූද සත්පුරුෂයන්ගේ සිත වෙනස් නොවන්නේය. මහමුහුද තණසුලකින් රත්කරන්නට නොහැකිවේමය.

17 දෙවො'පි සුචිරට්ඨායී
ගුණවා නා 'භිජායතෙ,
පුණ්ණො පණ්ණරසීරත්ති-
මෙව සොමො'පි තිට්ඨති.

භා. බොහෝකල් ජීවත්වන ගුණවතෙක් දෙවියෙක්වද නොඋපදියි. සඳ දෙවිතෙම පවා පණ්ණරසි පොහොය රෑ පමණක් සම්පූර්ණව සිටියි.

18 මතසො'ව ගුණා හීයො
හොන්ති සබ්බත්‍ථ පත්‍ථටා,
දඩ්ඪෙ අගරුඛණ්ඩස්මිං
ඵරතෙ සුරභී යථා.

භා. මළගියාහුගේම ගුණයෝ බෙහෙවින් සැමතැන පතළ වෙත්. අගිල් කැබැල්ල ද අළුව ගිය කල්හි සුවඳ පැතිරෙන්නාක් මෙනි.

19 නින්දෙය්‍ය සජ්ජනං යො සො
අත්තානං දූසයෙ සයං,
ආකාසෙ ඛිපතෙ ධූලිං
යො තම්මුද්ධනි සා පතෙ.

භා. යමෙක් සත්පුරුෂයෙකුට නින්දාකරන්නේ නම් හේ තෙමේ තමාම කිලිටු කරගණියි. යමෙක් අහසට දූලි ගසාදමයිද එය ඔහුගේ හිස මුදුනෙහිම වැටේ.

20 සාධූනං මජ්ඣගො නෙව
සොභතෙ නිග්ගුණො නරො,
සොභතෙ තිමිරෙ දීපො
නා'දිච්චකිරණෙ සති.

භා. සත්පුරුෂයන් මැදට පැමිණි ගුණ නැති පුරුෂතෙම නොහොබනේමය. පහන අඳුරෙහි මිස සූර්‍ය්‍යාලෝකය ඇතිකල නොහොබියි.

21 සන්තසංසග්ගතො ජන්තු
ජළො යාති පවීණතං,
සුවණ්ණවණ්ණතං යාති
මෙරුං නිස්සාය වායසො.

භා. සත්පුරුෂ සමවාය හෙතුකොට ගෙණ ජඩතෙමේද ඒකාන්තයෙන් සමර්ථබවට පැමිණේ. කවුඩුතෙම රන්මෙර ඇසුරුකොට රන්පැහැ ඇති බවට පැමිණෙයි.

22 අධිකං කරුණායන්ති
අපකාරිනි සජ්ජනා,
චන්දනො ඡිජ්ජමානො හි
ඵරසුං සුරභීයති.

භා. සජ්ජනයෝ තමන්ට අපකාර කරණ අය කෙරෙහි වඩා කරුණා කෙරෙති. ඒ එසේමය. සඳුන්රුක සිඳිනු ලබන්නේ පොරොව සුවඳ කරවයි

23 සබ්බෙසු'පි හි සත්තෙසු
කාරුණායන්ති සාධවො,
සබ්බස'මුච්චනිචානං
සීතලායෙව චන්දිකා.

භා. සත්පුරුෂයෝ (සාමාන්‍යයෙන්) සියලු සතුන් කෙරෙහිම කරුණා කෙරෙති. චන්ද්‍ර රශ්මිය උසස් පහත් සැමදෙනාට ශීතලමැයි.

24 අහෙජ්ජා සුඛසන්ධෙය්‍යා
සුජනා සුවිවුත්තිනො,
සොණ්ණකුම්භා න භිජ්ජන්ති
භින්නා ච සුඛසන්ධියා.

භා. පවිත්‍රවූ පැවතුම් ඇති සාධුජනයෝ පහසු වෙන් සමගිකළ හැකිවෙත්. රන්කළ නොබිඳෙති. බිඳුනත් පෑසිය හැකිවෙත්.

25 සාධූහි වුච්චමානං හි
ඵරුසම්පි සුඛාවහං,
අහිතාය භවෙ කින්නු?
ඛාරපක්ඛිපනං වණෙ.

භා. සුදනන් විසින් කියනු ලබන රළු තෙපුලද සැපගෙණ දෙන්නේමය. ව්‍රණයෙහි කර බෙහෙත් දැමීම අහිත පිණිස වන්නේද? නොවන්නේමැයි.

26 සාධුනො ඵරුසත්තෙ'පි
දයාසීතං භවෙ මනො,
නාළිකෙරඵලස්ස'න්තො
මධුරං බහි කක්ඛළං.

භා. සත්පුරුෂයාගේ රළු බවක් ඇති කල්හිද සිත කරුණාවෙන් සිහිල්වෙයි. නෙරළුපලයේ (පොල් ගෙඩියේ) ඇතුළත මිහිරියි. පිටත රළුයි.

27 සුභංවා අසුභං කම්මං
ඵලකාල'මපෙක්ඛතෙ,
සරදං ඵලතෙ සාලි
වසන්තෙ නහි කත්ථචි.

හා. යහපත්වූ හෝ අයහපත්වූ කර්මය තෙමේ පලදීමට සුදුසු කාලය බලාපොරොත්තුවෙයි. හැල් ගොයම සරත්කල්හි මුත් කිසිතැනෙකත් වසත්කල නොපැසෙයි.

28 මෙධා වයඣපොසසස
පරිනාමං නිගච්ඡති,
ජිණ්ණචන්‍දනරුක්ඛසස
ආමොදෙ උපජායතෙ.

හා. නිසිවියෙහි (ප්‍රඥ දශකයෙහි) පිහිටි පුරුෂයාගේ ප්‍රඥව මුහුකිරීමට (මේරීමට) යෙයි. කල්ගිය සඳුන් වෘක්‍ෂයාගේ සුගන්‍ධය හටගන්නේයි.

29 ඛායතෙ'ධික' මප්පමපි
විපදනන්තරං සුඛං,
කසායානන්තරං පීතං
ජලං සාදුතරං යථා.

හා. විපතකින් මිදුන ලහදී පැමිණි මඳ සැපයත් වැඩියක් මෙන් හැඟේ. කසායට පසුව බිව් ජලය ඉතා මිහිරිවන්නාක් මෙනි.

30 යතො හි ආගතො දෙසො
තතො එව නිවත්තතෙ,
අග්ගිදඩ්ඪස්ස විපෙථාටො
අග්ගිතෙ'වො'පසම්මති.

හා. යමකු වෙතින් විරදෙක් ආයේ නම් ඒ ඔහුවෙතින්ම නවතියි. ගින්නෙන් දැවහුගේ පොළය ගිනිපෙනහෙල්ලෙන් පිළිස්සීමෙන්ම සංහිඳෙයි.

31 යතිනො සංයතො වා'පි
මනො කාමාය ධාවති,
වත්‍යන්තරගතො ගොණො
දිසවා ධාවති සද්දලං.

හා. යතිහුගේ සංවෘතවූද සිත පස්කම් සැප පිණිස දිවේ. වැට බැඳ මැදිකළාවූද ගොන් තෙම තිල් තණකොළ දැක දුවයි.

32 නහි කාමෙ' භිගිජ්ඣන්ති
පණ්ඩිතා ඛණභඞ්ගුරෙ,
හංසා නා'මෙභාජකිඤ්ජක්ඛං
හිත්වා පත්‍ථෙන්ති නීලිකං.

භා. නුවණැත්තෝ ඇසිල්ලකින් නස්නා කම්සැප ගිජුව නොපතත්. හංසයෝ පියුම් කෙසරු හැර දියසෙවෙල් කැමති නොවෙත්.

33 කාමතණ්හා 'පභොගෙන
භොගීනං නො'පසම්මති,
ලවණොදකපානෙන
පිපාසා බලු වඩ්ඪතෙ.

භා. කාම භොගීන්ගේ කාමතෘෂ්ණාව කම්සැප විඳීමෙන් නොසංසිදේ. ලුණුදිය බීමෙන් එකාන්තයෙන් පිපාසාව වැඩෙයි.

34 ධනිනො දුජ්ජනෙ නිච්චං
භජන්තී'ති කිමබ්භුතං?
තිඨන්ති රතනා භියේ‍යා
විජිව්හානං හි මත්ථකෙ.

භා. ධනවත්හු නිතොර දුදනන්ම ඇසුරු කෙරෙති යනු කවර පුදුමයෙක්ද? රත්නයෝ බොහෝ සෙයින් සර්පයන්ගේ මස්තකයෙහිම තිබෙත්.

35 පරොපතාපලද්ධා හි
සම්පදා දුක්ඛකාරණා,
රත්නපාණං රත්නපාත-
මෙතාසංයෙව දුක්ඛදං.

භා. අනුන්ට දුක්දී ලද සැපත තමන්ගේ දුකට කාරණ වෙයි. ඒ එසේමැයි. පූඩාවන්ගේ (අනුන්පෙළා) ලේබීම ඔවුන් ටම දුක්දෙන්නේයි.

36 සභාවදුබ්භගො යො හි
සො විභූත්‍යා'පි තාදිසො,
ගොමයෙ තිඨතෙ ලක්ඛී
න තථා'පි මනොහරං.

භා. යමෙක් ප්‍රකෘතියෙන් නිඃශ්‍රීකවේ නම් හේතෙමේ සැපතිනිදු එබඳුමවේ. ගොමෙහි සිරිකාතගේ වාසය ඇති නමුත් මනහර නොවේ.

37 සන්තානයෙව සන්තං නිච්චං
විපදුද්ධරණක්කමා,
ගජානං පඞ්කමග්ගානං
ගජායෙව ධුරන්ධරා.

භා. සත්පුරුෂයෝම නිත්‍යයෙන් සුදනන් විපතින් ගොඩ ළීමෙහි සමර්ථවෙත්. මඩෙහි එරුණු ඇතුන්ගේ බර උසුලන්නාහු (ඔවුන් ගොඩගන්නාහු) ඇත්තුමය.

38 අතිඩාදිඩලාහෙ'පි
න සුභා ජායතෙ ගති,
යත්‍ර'ත්ථි විසසංසග්ගො
මරණාය'මතම්පි තං.

භා. අනිෂ්ටයෙකුගෙන් ඉෂ්ටලාභයක් ඇති කල්හිදු යහපත් ගතියක් ඇති නොවේ. යමක විෂමිශ්‍රබව තිබේ නම් එය අමාවක් වුවත් මරණය පිණිසවෙයි.

39 හෙස්සන්තීනං විපත්තීනං
හිතො'ප්‍යා'යාති හෙතුතං,
මාතු ජඞ්ඝා හි වච්ඡස්ස
ථම්භීභවති බජ්ඣතෙ

භා. මත්තෙහි ඇතිවන විපත්වලට හිතවූ දෙය පවා හෙතු බවට පැමිණේ. ඒ එසේමය. මව්දෙනගේ කෙණ්ඩය වස්සා බැඳීමෙහි කණුවක් වෙයි.

40 අපි බුද්දකවත්ථූන–
මත්ථං සාධෙති සංහති,
තිණෙහි කතයොත්තෙන
බජ්ඣන්තෙ මත්තදන්තිනං.

භා. කුඩා වස්තූන්ගේද එක්වීම ඉෂ්ටාර්ථය සිද්ධකරයි. තණ කොළ එකතුකොට ඇඹරූ යොතින් මදැතු බඳිත්.

41 සජාතියෙහි පොසෙහි
අපි සඞ්ගතිරුත්තමා,
ථුසෙනා'පි පරිච්චත්තා
නප්පරොහන්ති තණ්ඩුලා.

භා. පිසාදෙනාවූද ස්වජාතීයයන් හා එක්වීම උතුම්. දව සෙයියා පොත්තෙනුදු තොරවූ සහල් පැළ නොවෙති.

42 න සක්කොති ජරීකාමෙ
භුඤ්ජිතුං වජිතුම්පි වා,
ලිහෙය්‍ය'ව'ට්ඨිකං සොණො
ඛණ්ඩදන්තො'පි නිද්දයං.

භා. ජරාවට පැමිණියේ කම්සැප බුදින්නටවත් අතහරින්නටවත් නොහැකිවෙයි, දත්වැටුනාවූද බලුතෙම ඇට කැබැල්ල (හල නොහැකිව) තරයේ ලොවීමැයි.

43 දෙසඞ්කිතස්ස අනාරම්භො
සාපුරිසස්ස ලක්ඛණං,
අජීරණභයා කො හි
භොජනං නෙව භුඤ්ජති?

භා. වරදෙක් වේදේ යන බියෙන් කටයුතු පටන් නොගැණීම නින්දිත පුරුෂයාගේ ලක්ෂණයෙකි. අජීරණවේදේයි හයින් කවරෙක් නම් බොජුන් නොවලඳම හරියිද?

44 සම්මානං වඩ්ඪනං වා'පි
බලානං නහි පිතියා,
ඵලන්ත්‍ය'මතසෙකො'පි
න සාදූනි විසද්දුමා.

භා. බුහුමන් කිරීමවත් වැඩිදියුණු කිරීමවත් දුජනයන්ගේ ප්‍රිතිය පිණිස නොවේමය. අමාදිය වත්කිරීමක් ඇතිකල්හිදු විෂ වෘක්ෂයෝ මිහිරි පල නොදෙත්.

45 ගුණදෙසාවිචාරෙන
පූජනං දණ්ඩනම්පි වා,
අනත්ථාය යථා සප්ප-
මුඛෙ හත්ථප්පසාරණං.

භා. ගුණදෙස් පිරික්සා නොබලා පිදීම හෝ දඬුවම් කිරීම අවැඩ පිණිස වේ. සර්පයකුගේ මුඛයෙහි අතපෙවීමක් මෙනි.

46 හීනො න සෙවිතබ්බො හො!
සෙවිතබ්බොව උත්තමො,
පයො'පි ධුත්තහත්ථට්ඨං
සුරා'ති අභිධීයතෙ.

භා. භවත්නි!ගුණයෙන් හීනයෙක් නොසෙවිය යුත්තේය. උතුමෙක්ම සෙවිය යුතුවේ. රා සොඩහුගේ අතෙහි තිබෙන වතුරත් සුරායයි කියනු ලැබේ.

47. පරිසා සාමිනා චත්තා
සම්බා'පිහි භිජ්ජති,
බිණායුකං ජීවයති
ජීවකාචරියො'පි කිං?.

භා. ස්වාමිහු විසින් අත්හරිනලද පිරිස සම්බන්ධවූවත් තිදේමය. ජීවක වෛද්‍යාචාර්යතුමා වුවත් ආයු ගෙවුන ලෙඩෙකු ජීවත් කෙරෙයිද?

48 විඤ්ඤෙය්‍ය පඨමං ධීරො
ථොක'මෙව යථාක්කමං,
කමසො බින්දුපාතෙන
ඝටො'පි පරිපූරති.

භා. ප්‍රාඥතෙම පළමුකොට පිළිවෙළින් ටික ටිකම රැස් කරන්නේය. ඒ එසේමැනු. ක්‍රමයෙන් දියපොද හිමෙන් කළයද පිරෙයි.

49 එකො'ව ගුණවා පුත්තො
වරෙ දන්තුසතෙහි'පි,
අන්ධකාරනුදෙ එකො
චන්දොයෙව න තාරකා.

භා. ජඩවූ පුතුන් සියයකටත් වඩා එකගුණවත් පුතෙක්ම උතුම්වේ. එක සඳම බහලඳුරු දුරුකෙරෙයි. (බොහෝවූද) තාරකාවෝ එසේකළහැකි නොවෙති.

50 කිමත්ථො? පුත්තෙන ජාතෙන
යො න විඤ්ඤූ න ධම්මිකො,
කාණෙන චක්ඛුනා කිං වා?
පීළායෙව හි චක්ඛුනො.

භා. යමෙක් ශාස්ත්‍රඥ නොවෙනම් ධාර්මිකත් නොවේනම් එබඳු පුතෙක් උපන්නාසින් කවර ප්‍රයොජනද? කණවූ ඇසින් පලකිම? ඇසට පීඩාව පමණෙකි.

51 යස්ස නත්ථි සයං පඤ්ඤා
සත්ථ'මස්ස කරොති කිං?
ලොචනෙහි විහීනස්ස
දප්පණො කිං කරිස්සති?

භා. යමෙකුට තමාගේ ප්‍රඥව නැත්නම් ඔහුට ශාස්ත්‍රය කුමක් කෙරෙයිද? දෙඇස නැත්තෙකුට කැඩපත කුමක් කරන්නේද?

52 රූපවා'පිහි කොලඤ්ඤො
විජ්ජාහීනො න සොභති,
කිං? සුගන්ධවිහීනෙන
කිංසුකෙන පයොජනං.

භා. රුවඇති කුලවතෙක් වීනමුත් ශාස්ත්‍රඥානයෙන් තොරවූයේ නොහොබියි. සුවඳ නැති සැලමලෙන් ප්‍රයොජන කවරේද?

53 දුජ්ජනො වජ්ජනීයො'ව
විජ්ජාය'ලඞ්කතො'පි හො!
මණිනා භූසිතො චෙ'පි
සප්පො කිං? න භයඞ්කරො.

භා. භවත්නි! ශාස්ත්‍රඥානයෙන් සැරසුනේවී නමුත් දුර්ජනතෙම දුරුකටයුත්තේමය. ගෙලමිණිරුවනින් සැරසුනත් සර්පතෙම භයඞ්කර නොවේද? වේමැයි.

54 බාලාන'මුපදෙසො හි
කොපායෙ'ව පවත්තතෙ,
විසං වඩ්ඪති සප්පානං
ඛීරපානෙන සබ්බථා.

භා. අඥයන්ට උපදෙස් දීම වනාහි ඔවුන්ගේ කොපය පිණිසම පවතියි. ඒ එසේමය. සර්පයන්ට කිරිපෙවීමෙන් ඔවුන්ගේ විෂය හැමලෙසින්ම වැඩෙයි.

55 සත්තුනා නහි සංසග්ගො
සුරත්තෙනා'පි කාරියො,
සන්තත්ත'මපි පානීයං
සමයත්‍යෙ'ව පාවකං.

භා. තමා කෙරෙහි ඉතා ඇළුනාවූද සතුරකු හා එක්වීම නොකටයුතුයි. ඉතා රත්වූද ජලයතෙම ගින්න නිවාමැයි.

56 පරො'පි හිතවා බන්ධු
බන්ධු'පි අහිතො පරො,
අහිතො දෙහජො ව්‍යාධි
හිතං ආරඤ්ඤ'මොසධං.

භා. සතුරෙක් වුවත් හිතවත්වූයේ නෑයෙකි. නෑයෙක් වුවත් අහිතවූයේ සතුරෙකි. තමාගේ සිරුරෙහි හටගත්තාවූද රොගය අහිතවෙයි. වෙනෙහි උපන් බෙහෙතද පථ්‍යවේ.

57 ධුවං ගුණවතා තෙව
ගුණවා යෙව ජායතෙ,
ගන්ධසාරම්හි සඤ්ජෙඩ්
ඣාරිකා න සුගන්ධිනී.

භා. එකාන්තයෙන් ගුණවතෙකුගෙන් ගුණවතෙක්ම නොඋපදනේමය. සඳුන දැවූකල්හි අළු සුවඳ නොවේ.

58 පරිහීනාපි සුජනා
නිග්ගුණා න භවන්ති හි,
සුවණ්ණපාති භින්නා'පි
අනග්ඝා න භවෙය්‍ය කිං?

භා. පිරිහුනාවූද සුදනෝ ගුණනැත්තාහු නොවෙත්මය. රන්තලිය බිඳුනත් අනගි නොවේද? වේමැයි.

59 සස්සභාවගතං සන්තො
අත්තානං'මිව මඤ්ඤරෙ,
පදීපුජ්ජාලිතො දීපො
යථා'නෙඤ්ඤ'ව දිප්පතෙ.

භා. සත්පුරුෂයෝ තමන්ගේ සවභාවයට පැමිණියහු තමන් මෙන් හගිත්. පහනින් දැල්වූ පහන එකසේම දිලෙන්නාක් මෙනි.

60 පාදමූලගතං සත්තුං
න ච නාසෙන්ති සත්තමා,
පදීපයට්ඨි මූලට්ඨං
තිමිරං න ජහෙස්සති.

භා. උත්තමයෝ පාමුලට පැමිණි සතුරු නොනසති. පහන්රුක තමා මුල තිබෙන අඳුර නොහරින්නේයි.

61 හිතාය හොති සුජන-
හත්ථගං මච්ඡරීධනං,
ලවණම්බු භවෙ මෙඝ-
සම්පයොගා' මතං විය.

භා. මසුරාගේ ධනය සුදනන් අතට පැමිණියේ හිත පිණිස වෙයි. ළුණුදිය මෙඝය හා එක්වීමෙන් අමාවක් වැනිවේ.

62 සම්පයොගා'පි මක්ඛීනං
නාච්චජෙ සගුණං ගුණී,
නිම්බද්දුමස්ස සාඛාය
බද්ධම්පි මධුරං මධු.

භා. ගුණවත් තෙමේ ගුණමකුවන්ගේ එක්වීමෙනුදු තමාගේ ගුණය නොහරියි. මීය කොසඹ අත්තෙහි බැඳි නමුත් මිහිරි වේමය.

63 සප්පඤ්ඤා කපණං සතොතා
පරං මොචෙතාති දුක්ඛතො
කාරෙ නිද්දරථං වාහා
නිවාතා වීජති යථා.

භා. දුක්පත්වූද සත්පුරුෂයෝ දුකට පැමිණි අනුන් දුකින් මුදවති සුලංනැති විජිනිපත සුලංගන්වා ගිම් නැති කරන්නාක් මෙනි.

64 මජ්ඣගො'පිහි සත්තූනං
සුඛං වසති පඤ්ඤවා,
න ච තාළියතෙ ජිව්හා
චතත්තිංසදසනන්තරෙ.

භා. නුවණැත්තේ සතුරන් මැදට පැමිණියේද සුවසේ වෙසෙසි. දිව දෙතිසක් දත්මැදත් නොතැළෙයි.

65 තං තං ඨපෙය්‍ය ඨානස්මිං
ජානිත්වාන ගුණං සුධී,
සක්කො'පි සුරියං හිත්වා
නනු චන්දෙ ලිඛී සසං?.

භා. ප්‍රාඥතෙමේ ගුණ දැන ඒ ඒ අය සුදුසු තැන තබයි. සක්දෙවිඳුන් ඉරතිබියදී සඳ මඩලෙහි සා රුව ඇන්දේ නොවැ?

66 සාධෙය්‍ය'මපි නීචෙහි
තෙහි සාධෙති බුද්ධිමා,
බහුසොණ්ණො'පි චන්දනං
ලොහාදාසෙන පස්සති.

භා. නුවණැත්තේ පහත් අයගෙන් වුවත් සිදුකර ගතයුතු දෙය ඔවුන්ගෙන් සිදුකර ගණියි. බොහෝ රන් ඇත්තේද ලොහෝ කැඩපතින් මුහුණ බලයි.

67 එකො එකස්ස චතුරො
අපරස්සො'තරො තථා,
නො'දකෙ සකටං නාවා
ථලම්හි ච න ගච්ඡති.

භා. එකෙක් එකකට දක්ෂවේ. එසේම අනෙකෙක් අනෙකකට දක්ෂවෙයි. දියෙහි ගැල නොයේ. ගොඩෙහි නැවද නොයෙයි.

68 එකකුච්ඡිගතානම්පි
ගුණො ජන්තූන'මඤ්ඤථා,
ජලජානං යථා ගන්ධො
මච්ඡස්ස පදුමස්සච.

භා. එකකුස හොත්තාවූද සත්ත්වයන්ගේ ගුණය වෙනස් වෙයි. එකම ජලයෙහි උපන්නාවූ මත්ස්‍යයාගේද පද්මයාගේද සුවඳ දුගඳමෙනි.

69 දුක්ඛප්පත්තා මහන්තානං
නාමං වත්වා පමුච්චරෙ,
සප්පදට්ඨං සුපණ්ණස්ස
කාරෙන්ත්‍යා'ණාය නිබ්බිසං.

භා. දුක්පත්තු මහතුන්ගේ නමකියා ගැලවෙති. සපු විසින් ඩයාත ලද්දහු ගුරුළු රජුගේ අණකියා (මතුර) නිර්විෂ කෙරෙති.

70 අකාලෙ අත්තනො ඨානෙ
තුණ්හීභාවො පසංසියො,
කුමුදෙසු හසන්තෙසු
සංකුචන්ති සරොරුහා.

භා. තමාට කථාවට නොසුදුසු තැන මුවෙන් නොබැණ හිඳීම පැසැස්ස යුත්තේය. කුමුදු පුබුදු වනකල පියුම් හැකිලෙත්.

71 ථද්ධළුද්දගුණානං හි
පතිට්ඨා හොන්ති තාදිසා,
වෙරී හුත්වාන විධුනො
චොරානං සරණං තමො.

භා. තද රුදු ගුණ ඇත්තවුන්ට එබන්දෙම පිහිටවෙති. අඳුර සඳට සතුරුව සොරුන්ට පිළිසරණවෙයි.

72 දෙවෙහි'පි මහාපුඤ්ඤා
නරා හොන්තෙ'ව උත්තමා,
නරවෙසෙන මන්ධාතා
දෙවරජ්ජං කරී නනු?

භා. මහ පින්ඇති මිනිස්සු දෙවියන්ටත් වඩා උතුම්වෙති. මන්ධාතු මහරජ මිනිස්වෙසින් සක්දෙව් රජය කළේ නොවැ?

73 තාව සොභති ලොකො'යං
යාව පුඤ්ඤං න ඛියති,
දීපො පජ්ජලතෙ තාව
යාව තෙලං න ඛියති.

භා. මේ ලෝවැසි තෙම පිණ නොගෙවෙනතාක් හොබිසි. පහනද තෙලනොදු තිබෙනතුරු බබලයි.

74 සබ්බසම්පත්තිසම්පන්නං
ඨානං කින්නු? සියා භුවි,
යක්ඛන්ති මනුස්සානං
නනු'ත්තරකුරූසු'පි.

භා. ලොව කිනම් තැනක් සියලු සැපතින් සමුඩුවන්නේද? උතුරුකුරු දිවයිනෙහිත් මිනිසුන්ට යකුන් ගෙන් බියනොවෙද?

75 කන්තාරෙ පුඤ්ඤපාපාන-
මෙකඨානෙ'ව දිස්සරෙ,
යානාරූළ්හ මහාභොගෙ
බන්ධත'ඤ්ඤෙ වහන්ති හි.

භා. පින් පව් කරන දෙකොටස එකතැනම දක්නා ලැබෙත්. ඒ එසේමය. යානවලට නැගුණාවූ මහ දනවතුන් වෙන අය කඳටින් උසුලත්.

76 සුවණ්ණං නව ගණ්හන්ති
නිවා ගණ්හන්ති සත්තමා,
සිළන්තා මන්තවසිනො
න හොන්ති භුජගාවිය.

භා. ගුණහීනයෝ මනාබසක් නොපිළිගණිත්. උතුමෝ පිළිගණිත්. ගරඬියෝ නාගයන්මෙන් මන්ත්‍රයට කීකරු නො වෙති.

77 පරිත්තවත්ථුදානෙන
ලභෙය්‍ය ධනිතො ධනං,
පභඞ්කරස්ස පූජය
පදීපුජ්ජාලනං යථා.

භා. සුළුවූ දැකුම්වතක් දීමෙන් ධනවත්හුගෙන් වස්තුව ලබන්නේය. සූර්‍ය්‍යයාට පුදපිණිස පහන් දැල්වීම මෙනි.

78 දානොපභොගරහිතා
භොගා පුඤ්ඤවතො සියුං,
රසනා වින්දතෙ දන්ත-
ඛාදිතස්ස යථා රසං.

භා. දන උපභොග දෙකින් තොරවූ (මසුරාගේ) සම්පත්හු පිණැත්තෙකුට අයිති වන්නාහ. දතින් කනලද ආහාරයාගේ රසය දිව විඳගන්නාක්මෙනි.

79 විරූඩා තෙජවන්තානං
ගුණවන්තෙ ජහන්ති න,
චන්දෙන සද්ධිං වසති
රවිභින්නං මහාතමං.

භා. තෙදවතුන්ට සතුරුවූවාහු ගුණවතුන් අත්නොහරිති. හිරුගෙන් වෙන්වගිය මහඅඳුර අවපස සඳ සමග වෙසෙයි.

80 ඌනාතිරෙකතා ලොකෙ
හොති පුඤ්ඤවතම්පි භො!
හානිවුඩ්ඪිං මහාපුඤ්ඤො
යාති කාලෙන චන්දිමා.

භා. භවත්නි! අඩුවැඩිබව ලොව පිණැත්තවුන්ටත් වේමය. මහපින් ඇති සඳදෙව්තෙම කලින්කල අඩුවීමටත් වැඩීමටත් යෙයි.

81 අනෙකපරිවාරො'පි
භාවිකං න නිසෙධයෙ,
තාරකාපරිවාරම්පි
රාහු චන්දං ගහෙස්සති.

භා. නොඑක්දෙනා පිරිවරකොට ඇත්තේද සිදුවියයුතු දෙය වළකාගත නොහෙන්නේය. තරු පිරිවැරුවාවූද සඳ රාහු තෙම අල්වා ගන්නේයි.

82 සුඛපුඤ්ඤවතො දුක්ඛං
චිරෙනා'පි න හෙස්සති,
මිගා යථා න ගච්ඡන්ති
ඛෙත්තං පිරවතීයුතං.

භා. හුදු පිණැත්තහුට බොහෝ කලකිනුත් දුකෙක් නොවන්නේය. තරවූ වැට ඇති කෙතට මුවන් නොයන්නාක්මෙනි.

83 ධාරෙන්තා'පන'චලං සත්ථං
චපලා චපලා'ව භො!
ඡායා'පි නනු? චන්දස්ස
චඤ්චලා චඤ්චලෙ ජලෙ.

භා. භවත්නි! නිශ්චලවූ ශාස්ත්‍රය දරන්නාහු තමුත් චපලයෝ චපලයෝමය. සෙලවෙන දියෙහි සඳ සෙවනැල්ලත් සෙල වෙන්නේම නොවෙද?

84 න වදන්තො'ව මච්ඡෙරා
දෙථ දනානි කස්සචි,
සබ්බලොකාධිපො වෙ'පි
කිනානු? මූගො කථෙස්සති.

භා. මසුරෝ කවරෙකුටවත් දනක් දෙව්යයි නොකියත් මය. මුළුලොවට අධිපතිවූවත් ගොළුවා කථාකරන්නේද? නැත.

85 වජ්ජාරහං දණ්ඩකම්මං
කාරපෙය්‍ය නචා'ධිකං,
අග්ගි'මොදනිකො භත්ත-
පචනස්සා'රහං යථා.

භා. වරදට සුදුසු දඬුවම මිස වැඩි දඬුවම් නොකරවන්නේය අරක්කැමියා බත ඉදීමට තරම් ගිනි කරන්නාක්මෙනි.

86 කුලීනම්පි න නිතෙජං
සල්ලක්ඛෙති නරං ජනො,
වන්දන්ති'ද්ධං සමායො'ක-
වාරං නිච්චම්පි භාකරං.

භා. ලෝවැසිතෙම කුලවත්වූද තෙද නැත්තහු නොසලකයි. ඒ එසේමය. අව්රුද්දකට වරක් සඳ වඳිත්. නිතොරම (තෙද ඇති) හිරු වඳිති.

87 නචා'දියති ඔවාදං
සුරාධුත්තො කදාචි'පි,
සඤ්ඤදන්තො'පි යථා යාති
විපිනං මත්තගජ්ජිතා.

භා. සුරාධූර්තයෙක් (රා සොඬෙක්) කවදාවත් අවවාදයක් නොපිළිගණියි. අකුස්සෙන් සත්කරණලද්දාවූද මදැතු කැලයට දුවන්නාක්මෙනි.

88 බලො වෙ'පි න ජානාති
ජානාති සුජනො ගුණං,
කුසලො මණිකාරො'ව
මණිං පාසාණමජ්ඣගං.

භා. දුදනා ගුණ නොදනිතත් සුදනතෙම ගුණදනියි. ගල මැද තිබෙන මිණිරුවන (වෙන අය නොදනිතත්) දක්ෂවූ මිණිකරුවා දන්නාක්මෙනි.

89 න නස්සතෙ'කො සුජනො
අපි දුජ්ජනමජ්ඣගො,
අග්ගිමජ්ඣම්පි සම්පත්තො
සීතවාතො න නස්සති.

භා. දුදනන් මැදට පැමිණ එකලාවූද සජ්ජන තෙම නොනස්නේය. සිහිල් සුලඟ ගිනිමැදට වන්නත් නොනස්නේයි.

90 පුරා පුඤ්ඤ'මකත්වාන
ජනො'දුනි සුඛීයති,
අවපිත්වාන කෙදුරං
ධඤ්ඤ'මිච්ඡං යථා ජළො.

භා. ලෝවැසිතෙම පෙර පින්නොකොට දැන් සුවපතයි. කුඹුරක් නොවපුරු වී කැමතිවන ජඩයෙකු මෙනි.

91 අවිචාරකතං කම්මං
පච්ඡාතාපාය වත්තතෙ,
බාදිතං මරණායෙ'ව
කිම්පක්ක'මවිචාරිය.

භා. සොයා බැලීමක් නැතිව කළකටයුත්ත පසුතැවිල්ල පිණිස පවතියි. විචාරණයක් නොකොට විෂ අඹය කනලද්දේ මරණය පිණිසම වෙයි.

92 පිරසාරගුණා සන්තො
මජ්ඣට්ඨා සබ්බජන්තුසු,
සුරාසුරපුරානං හි
මෙරුරාජා'සි මජ්ඣගො.

භා. නිරසර ගුණඇති උතුමෝ සැම සතුන් කෙරෙහි මධ්‍යස්ථවෙත්. ඒ එසේමැයි. සුනෙරගිරි රජතෙම සුරපුර අසුර පුර දෙකට මැද පිහිටියේය.

93 නිරයං යාති පාපිච්ඡො
මතම්මත්තො'ව සාහසො,
නිබ්බාපිතමහි පජ්ජොතෙ
අන්ධකාරං යථා ඝරං.

භා. සැහැසිවූ පවිටු පුරුෂතෙම එකෙණෙහි මළේම (මැරෙනකොටම) නිරයටයෙයි. පහන නිවූ ඇසිල්ලෙහිම ගෙය අඳුරුවන්නාක් මෙනි.

94 එලං දදති සක්කාරෙ
සජ්ජනෙසු'ති නිච්ඡිතං,
වඩ්ඪිතො දකසෙකෙන
නාළිකෙරො දකං දදෙ.

හා. සත්පුරුෂයන්ට කළ සත්කාරය පලදෙන්නේය යනු එකාන්තයි. පැන්වත්කොට වඩනලද පොල්ගස පැන්දෙයි.

95 දත්වා'පි පය්විං සබ්බං
නවා'රුධෙය්‍ය දුජ්ජනං,
කදහි ලබ්භතෙ? තෙලං
පීළයිත්වාන වාළිකං.

හා. මුළු මහපොළොව දී නමුත් දුදනා සිත් ගත නොහැකිය. වැලි මැඩ තෙලක් කාවදනම් ලැබේද?

96 විතථං න භවත්‍යෙ'ව
සාධූනං වචනං කචි,
කද උදෙති? සුරියො
පච්ඡිමායං දිසාය භො!

හා. සත්පුරුෂයන්ගේ වචනයක් කිසිතැනෙක බොරු නොවේමය භවත්ති! කවරදිනෙක පැළදිග්හි ඉර-උදාවේද?

97 සොකො බාලෙසු කොපො'පි
චපලෙසව'භිවඩ්ඪතෙ,
නනු සුක්ඛෙසු දහනො
ඉන්ධනෙසු පවඩ්ඪතෙ?

හා. අඥනයන් කෙරෙහි ශොකයත් චපලයන් කෙරෙහි කොපයත් වැඩෙයි. වියලි දරෙහි ගින්න වැඩෙන්නේනොවෙද?

98 සත්ථඤ්ඤාණවිහීනො හි
ගුණදෙසං න පස්සතෙ,
අන්ධො හත්ථතලට්ඨම්පි
පදීපං කින්නු? පස්සතෙ.

හා. ශාස්ත්‍රඥනයෙන් තොරවූයේ ගුණදොස් නොදකීමය. අන්ධයා තමාගේ අල්ලෙහි තිබුනත් පහණ දකීසිද?

99 බාලතො'පි ගහෙතබ්බං
යුත්ත'මුත්තං සුවිඤ්ඤුනා,
රවිතො උදයෙ'ප්‍ය'ත්ථි
පදීපස්ස පකාසනං.

භා. කියනලද යුත්ත නුවණැතියහුවිසින් බාලයකු ගෙන් වුවත් ගතයුතුය. ඉර උදවනකල්හිදු පහනේ බැබලීමක් තිබේ.

100 වත්තා කරොති කිං? තත්‍ථ
සොතාරො යත්‍ථ දුල්ලභා,
නගගමාංනුසකො දෙසෙ
රජකො කිං කරිස්සති?

භා. යම් තැනෙක අසන්නෝ දුලීභවෙත් නම් එතැන කියන තැනැත්තේ කුමක් කෙරෙයිද? නග්න (රෙදි නොහඳින) මිනිසුන් ඇති රටෙහි රදතෙමේ කුමක් කාරන්නේද?

101 ආයු'මාදය මච්චාන-
මහොරත්තා වජන්ති හො!
නනු සොතා වජනෙත'ව
සමාදය නදීජලං.

භා. භවත්නි! දිවාරාත්‍රීහු මනුෂ්‍යයන්ගේ ආයුෂය රැගෙණ යෙත්. ශ්‍රොතස්හු (සැඩපහර) ගඟදියත් හැරගෙණ යන්නාහුම නොවෙත්ද?

102 සංයොගො පියවත්‍ථුහි
පච්ඡා භවති දුක්ඛදො,
ඉඬො'පි අහිතාහාරො
පරිනාමෙ'තිදරුණො.

භා. ප්‍රිය වස්තූන් හා එක්වීම පසුව දුක් දෙන්නේවෙයි. මිහිරිවූද අපථ්‍යවූ ආහාරය පැසවීමෙහිදී (රොගොත්පාදක හෙයින්) දරුණුවේ.

103 කාමෙනා'සත්තතං යාති
මච්චුනො'යං මහාජනො,
වජ්ඣා'නුපද'මාසන්නො
භවත්‍යා 'ඝාතනස්ස හි.

භා. මේ මහාජනතෙමේ ක්‍රමයෙන් මරහුට ලංවීමටයෙයි. වධයට නියමවූ පුරුෂතෙම පියවරක් පාසා වධ භූමියට ලංවේමය.

104 අනුක්කමණ'මයං සායො
බීයමානො න දිස්සතෙ,
ජලකො ආමකුමෙහා හි
අදිස්සමානො විලීයති.

භා. මේ කයතෙම ඇසිල්ලක් පාසා ක්ෂයවන්නේ නොදක්නා ලැබෙයි. ඒ එසේමය. දියෙහි තැබූ අමු මැටිකළය නොපෙණීම දියවී යෙයි.

105 පයාසා සිථිලා හොන්ති
සරතො මරණං ධුවං,
චම්මබන්ධා යථා සිත්තා
මහතා වුඩ්ඪිවාරිනා.

භා මරණය නිතොර සිහිකරන්නහුගේ ප්‍රයත්නයෝ (තදවෑයම්) ශිථිල (බුරුල්) වෙති. මහත් වැසිදියෙන් තෙමීගිය සම්වර බැම්මෙනි.

106 පරෙසං දොස'මීසම්පි
පස්සතෙ නා'තතනො ජනො,
පස්සන්තම්පය 'බිලං චක්ඛු
අත්තානං නෙව පස්සති.

භා. මේ මහාජනතෙම අනුන්ගේ සවල්පවූද වරද දකියි. තමාගේ වරද නොදකියි. (අබඇටය පටන් මහමෙර දක්වා) සියල්ල දක්නාවූද ඇස තමා නොදක්නේමය.

107 න විස්සසති සාධුම්පි
බලදූසිතමානසො,
බාලො පායාසදඩ්ඪො හි
ජූකාරං භුඤ්ජතෙ දධිං.

භා. දුදනන් විසින් කෙලසනලද සිතඇත්තේ සත්පුරුෂයකුදු විශ්වාස නොකරයි. ඒ එසේමය. උණුකිරිබතින් දැවාවූ ළදරුතෙම දීකිරද ජුත්කාර කෙරෙමින් (පිඹ පිඹ) අනුභව කෙරෙයි.

108 පරිත්තදෙසං දිස්වාපි
න ගණ්හන්ති මහාගුණෙ,
සසඞ්කං කොමුදීජන්තං
න පස්සන්ති'ඤ්ඤෙ ජනා.

භා. මහගුණ ඇත්තකු කෙරෙහි මඳවරදක් දුටත් (නුවණැත්තෝ) එය නොගණිති. චන්ද්‍රයාණන්ගේ රශ්මියෙන් වැසීගියාවූ සසලපය උදවිය නොදකිත්.

109 බලවන්තම්පි නිතෙජ-
මභිමද්දන්ති වෙරිනො
නිස්සඞ්ක 'මක්කමන්තී'හ
භස්ම'මෙව න කුක්කුළං.

භා. බලසම්පන්නවුවත් තෙදනැත්තහු සතුරෝ මඩිත්. මේ ලෙව්හි (කව්රුත්) අළුගොඩක්ම නිසැකව පාගත්. උණුඅළු නොපාගත්.

110 නා'වමානං සහෙ මානී
වජ්ජමානො'පි ජීවිතං,
භිජ්ජන්තා වෙ'පි භාරෙන
සිලාථම්භා නමෙය්‍ය කිං?

භා. අභිමන් ඇතියේ දිවිපුදතත් අවමන් නොඉවසයි. ගල්ටැඹ බරකින් බිඳෙතත් නැමෙන්නේද? නැත.

111 මීයතෙ හදයී කාමං
කපණත්තං න ගච්ඡති,
අපි නිබ්බායතෙ අග්ගි
න භවත්‍යෙ'ව සීතලො.

භා. උදුරයිත් ඇත්තේ ඒකාන්තයෙන් මැරෙයි. (එහෙත්) බැගෑබවට නොයෙයි. ගින්න නිවියතත් සිහිල් නොවේමය.

112 මහද්ධනෙ'පි ඵරුසෙ
නො'පයන්තෙ'ව දුග්ගතා,
උපගච්ඡති කිං? ලොකො
සමුද්ද'මුදකත්ථිකො.

භා දුක්පත්හු මහදනැත්තාවූද රළු උදවිය වෙතට නොයෙත්මය. පැන්බොනු කැමති ලෝවැසි තෙම මුහුදකරු යේද? නොයේමැයි.

113 දුග්ගතා'පි මහාසත්තා
පරත්ථනිරතා සියුං,
කූපො ජනං සුඛයති
න සමුද්දො බහූදකො.

භා. දුක්පත්වූද මහාසත්වයෝ පරාර්ථයෙහි ඇළුනාහුවෙති ඒ එසේමැයි. (මඳදිය ඇත්තාවූද) ළිඳ මහාජනයා සුවපත් කරවයි. බොහෝ ජලය ඇති මුහුද එසේ නොකරයි.

114 අත්‍ථානත්‍ථ'මහඤ්ඤය
මිච්ඡාඝොසෙනත්ති බාලිසා,
ගජ්ජිතෙන හි මෙඝානං
සරදෙ කිං පයොජනං?

හා. අඥනයෝ අර්ථය හෝ අනර්ථය නොදන බොරුවට කෑගසති. ශරද සෘතුවෙහි මෙඝයන්ගේ ගිගුරුමෙන් කවර ප්‍රයෝජනද?

115 පසඞ්ගතො'ව සංසාරෙ
සඞ්ගච්ඡන්ති සරීරිනො,
දිට්ඨනො'ත්‍ර පථාචීනං
තරුච්ඡායාසු සඞ්ගමො.

හා. සසර (සැරිසරන) සත්‍වයෝ නියමයක් නැතිවමත් එකතැන්වෙති. මෙකරුණෙහිලා මගීන්ගේ රුක් සෙවන්හි එක තැන්වීම උදහරණයි.

116 සමායනතිච සංසාරෙ
අපයනතිච දෙහිනො,
සමුද්දෙ දරුඛණ්ඩානි
සමායනත්‍ය'පයනතිච.

හා. සත්‍වයෝ සසරදී එකතැන්දවෙති. වෙන්වදයෙති. මුහුදෙහි දුවකඩ (ලී කෑබලි) එකතුදවෙති. වෙන්වදයෙති.

117 පරිසාය'ත්තනො සාමී
රක්ඛිතබ්බො යථාබලං,
සමූලොයෙව රුක්ඛොපි
ඵලදෙ හොති නා'ඤ්ඤථා.

හා. පිරිස විසින් තම හිමියා හැකිපමණින් රැක්කයුතුයි. රුකක්වුවත් මුල ඇත්තේම පලදෙන්නේවෙයි. නැතිනම් නැසෙයි.

118 විපන්නො බුජ්ඣතෙ සාමං
විස්සසිත්වාන වෙරිසු,
රුක්ඛග්ගෙ සුපිතො තමහා
පතිතො පටිබුජ්ඣති.

හා. සතුරන් කෙරෙහි විශ්වාසකොට විපතට පැමිණියේ තෙමේම තේරුම්ගණියි. රුක අග නිදගත් පුරුෂතෙම එතැනින් වැටුනේ පිබිදෙයි.

119 ථාමවා'පන්' බලො හොති
තරෙ අවිසයං ගතො,
හිංසණො'පිච කුම්භීලො
ථලට්ඨො හොති දුබ්බලො.

භා. ශක්තිමත් පුරුෂයෙක්වුවත් අවිෂයස්ථානයට (අයිති නැති තැනට) ගියේ දුර්වලවෙයි. හිංසුණුවූද කිඹුල්තෙම ගොඩ සිටියේ දුර්වලවෙයි.

120 භිත්තාත'මෙව සඞ්ඛාතා
උපායඤ්ඤූ මහාමති,
සන්නිපාතං තිකිච්ඡන්තො
භිසක්කො'ව පසංසියො.

භා. වෙන්වූවන් සමඟිකරන මහාප්‍රාඥ තෙමේම උපාය දන්නේ නම්වේ. සන්නිපාතයට පිළියම් කරන වෙදතෙමේම පැසසිය යුත්තේයි.

121 මහතො මහතිං වා'පි
නිහන්ත්‍ය'විනයො සිරිං,
කිං නහන්ති? ජරා රූප—
මුත්තමස්සු'ත්තමම්පි භො!

භා. අවිනය (නොහික්මීම) තෙමේ මහතෙකුගේ මහත්වූ ශ්‍රිය පවා නසයි. ජරාතොමෝ උතුමෙකුගේ උතුම් රූපය වුවත් නොනසාද? නසාමැයි.

122 සච්ඡන්දචාරී එකො'ව
නීතිසත්ථානුගො පරො,
තෙජසො තිමිරස්සා'පි
සහවාසො කුහිං භවෙ !

භා. සියකැමතිසේ ක්‍රියාකරන්නේ එකෙක. නීතිශාස්ත්‍රානුගත ක්‍රියා ඇත්තේ අනෙකෙක්මය. තෙජස්හුගේත් අන්ධකාරයාගේත් (එළියත් අඳුරත්) එකතැන විසීමක් කොහිවන්නේද?

123 සත්ථඤ්ඤුතා කිමත්ථාය—
සම්පාදෙන්ති තදත්ථියං,
නා'ගදං ඤ්ඤත'මිච්චෙව
කාරෙය්‍යා'තඞ්කනිග්ගහං.

භා. ශාස්ත්‍රානුගත ක්‍රියාව සම්පාදනය නොකරන ශාස්ත්‍රඥ බව කුමටද? බෙහෙත උගත් පමණකින්ම රොගවැලැක්වීම. නොකරන්නේයි.

124 පච්චූහො සබ්බසිද්ධින-
මඩා'සඝනතා හවෙ,
අතිසීතම්පි සලිලං
භින්දතෙ'ව මහිතලං.

භා. නොඉවසීම (ඉක්මන් බලාපොරොත්තුව) ඒකාන්ත යෙන්ම සියලු කාර්‍යසිද්ධීන්ට අන්තරායකරවේ. ඉතා සිහිල්වූද ජලය පොළෝතලය බිඳගෙණ යේමය.

125 මහද්ධනා න රක්ඛන්ති
දුග්ගතෙ දුග්ගතා විය,
සෙය්‍යො නුහී මනුස්සානං
තිදිවෙ කප්පරුක්ඛතො.

භා. මහද්ධනවත්හු දුක්පතුන්මෙන් දුක්පතුන් නොරකිත්. මිනිසුන්ට දෙව්ලොව කප්රුකට වඩා නරලොව දළුක්ගස උතුම්.

126 ආයාචන'මපෙක්ඛන්තො
මහාකාරුණිකා 'පිච,
බ්‍රහ්මුනා'යාචිතො නාථො
ධම්මචක්කං පවත්තසි.

භා. මහකුළුණු ඇත්තෝ පවා අයැදුමක් බලාපොරොත්තු වෙති. ලොකස්වාමිවූ භාග්‍යවතුන්වහන්සේ මහබඹහු විසින් අයදිනලදුව දම්සක් පැවැත්වූසේක.

127 සබ්බා සම්පත්තියො තස්ස
සන්තුට්ඨං යස්ස මානසං,
පාදුකාවජ්ජිතපාදස්ස
චම්මච්ඡන්නා'ව මෙදිනී.

භා. යමකුගේ සිත සතුටුනම් ඔහුට සියලුම සම්පත්හු වෙති වහනින් වසනලද දෙපය ඇත්තහුට මුළුමහපොළොව සමින් වැසුනීම වෙයි.

128 නහි ධම්මවිහීනස්ස
පණ්ඩිච්චෙන පයොජනං,
පුච්ඡෙන කිං? සුවාණස්ස
යං න කොපීනඡාදනං.

භා. ධර්මයෙන් තොරවූවහුගේ පණ්ඩිතකමින් ප්‍රයෝජන යෙක් නොමැතියි. බලුගේ ලජ්ජාස්ථානය නොවසන නගුටෙන් කවර ප්‍රයෝජනද?

129 තිස්සයස්ස ගුණෙනේ'ව
සොභතෙ කොචි දුජ්ජනො,
සොභතෙ වනිතානෙතෙන
ඛිත්තං මලින' මඤ්ජනං.

භා. ආශ්‍රයාගේ ගුණයෙන්ම ඇතැම් දුදනෙක් හොබ නේය. කිලුටුවූ අඳුන අඟනුන්ගේ ඇසෙහි ලනලද්දේ හොබියි.

130 කරොනෙතා'පි අහිතානි
පියො යෙ:හි පියො'ව සො,
පචුරාදීනවොවා'යං
කායො කස්ස න වල්ලභො?

භා. අනිටුදෙය කරහත් යමෙක් ප්‍රියනම් හෙතෙම ප්‍රියවේමය. බොහෝ ආදීනව (වරද) ඇත්තාවූද මේ කය කවරෙකුට අප්‍රියවේද?

131 අනවජ්ජ'මපි නවජ්ජං'ව
පවීණා දස්සයන්ති හි,
චතුරා චිත්තකම්මෙසු
සමෙ නින්නුන්නතං යථා.

භා. දක්ෂයෝ බොරුවත් ඇත්තමෙන් පෙන්වත්මය. සිතුවම්හි දක්ෂයන් සමවූ භිත්ති ආදියෙහි පහත් උස්තැන් දක් වන්නාක්මෙනි.

132 ඨානෙ එවහි යුජ්ජනෙත
පුරිසා භූසණානිච,
සිරෙමණී න පාදෙසු
නූපුරෙ නහි මුඩනි.

භා. පුරුෂයෝද ආභරණයෝද සුදුසුතන්හිම යොදනු ලැබෙති. සිළුමිණ දෙපයෙහිත් සලඹ හිසමුදුනෙහිත් නොපළ දිනු ලැබේ.

133 වජන්තු'ඩ' මධොචෙව
සෙහි කම්මෙහි මානවො,
කත්තාරෙ යූපකූපානං
දිඨනතා'ත්‍ර භවන්ති හි.

භා. සත්ත්වතෙම ස්වකීය කර්මයෙන් උසසටද පහතටද යෙයි. මෙකරුණෙහිලා පයගක් ගරන ලිඳක් කණන දෙදෙන උදාහරණ වෙත්මැයි.

134 උඩ්ඩං ගති ගුණෙනෙ'හ
පුරිසස්සා'තිදුල්ලභා,
සිලායා'රොපනං සෙලෙ
බහූහි'පි සුදුක්කරං.

භා. මේ ලොකයෙහි පුරුෂයකුගේ ගුණයෙන් උසසට යෑම ඉතා දුලීභයි. පර්වතයක් මුදුනට ගලක් නැංවීම බොහෝ දෙනෙකු විසිනුත් ඉතාම දුෂ්කරවේ.

135 අධොගති නරස්සේ'හ
දොසහෙතු න දුක්කරා,
පාතියතෙ ඛණෙනෙ'ව
සිලා සෙලුච්චයා නනු?

භා. මේ ලෙව්හි දොෂහෙතුවෙන් පුරුෂයකුගේ පහත වැටීම දුෂ්කර නොවේ. පර්වතයක් මුදුනෙහි සිට ගලක් ඇසිල්ලකින් හෙළනු ලබන්නේ නොවේද?

136 සදත්ථායෙ'ව ජීවන්තො
නහි ලොකෙ පසංසියො,
කිං න ජීවති? කාකො'පි
පූරෙන්තො උදරං සකං.

භා. ආත්මාර්ථය පිණිසම ජීවත්වන තැනැත්තේ ලෙව්හි පැසසිය යුත්තේක් නොවේ. කව්ඩුතෙමේත් තමාගේ බඩ පුරවමින් ජීවත්නොවේද?

137 ධනාසා යස්ස ධම්මත්ථා
වරං තස්ස නිරාසතා,
පඞ්කස්ස පක්ඛාලනතො
දූරදඵුසනං වරං.

භා. යමකුගේ ධනතෘෂ්ණාව ධර්මය පිණිස වේනම් ඔහුගේ තෘෂ්ණා රහිතබව ඊටවඩා උතුම්වේ. මඩ තවරාගෙණ සේදීමට වඩා දුරදීම සපර්ශ නොකර (තවරානොගෙණ) සිටීම උතුම්.

138 කිංනු? මච්ඡරිනො දාන-
භොගහීනස්ස ජීවිතං,
නනු කම්මාරභස්තා'පි
නිස්සසන්ති න ජීවති?

භා. දීමය කැමය යන දෙකින් තොරවූ මසුරාගේ ජීවත්වීම කුමක්ද? කඹුරුසම (මයිනහම) සුසුම් හෙළනත් ජීවත් නොවන්නේ නොවේද?

139 සඤ්චිතස්ස හි විත්තස්ස
පරිච්චාගො'ව රක්ඛණං,
පරිවාහෙන වෙපුල්ලං
ජායතෙ වාපිවාරිනො.

භා. රැස්කරණලද ධනයාගේ පරිත්‍යාගයම රැක්මනම්වේ. වැව් ජලයාගේ පිටකිරීමෙන් වැඩිවීම වන්නේය.

140 ආයාචිතා මහන්තො'පි
පරත්ථනිරතා සියුං,
පායනිච්ඡා භවෙ මාතු
රුදිතෙ සති සූනුනො

භා. මහත්වරු වුවත් අයදිනලද්දහුම පරවැඩෙහි ඇලුනාහු වෙත්. පුත්‍රයාගේ ඇඬීමක් ඇතිකල්හි මෑණියන්ට කිරිපොවනු කැමැත්ත ඇතිවෙයි.

141 අන්තොගධො'ව සංඛිත්තෙ
විත්ථාරෙ හොති සබ්බථා,
මහන්තො'ප්‍ය'ග්ගි සූරියං
නා'තික්කමති තෙජසා.

භා. විස්තරය සැමලෙසින්ම සංක්ෂෙපයෙහි ඇතුළත්වේමය. මහත්වූද ගින්න තෙජසින් හිරු ඉක්ම නොයන්නේයි.

142 එකකො න විරුජ්ඣෙය්‍ය
ජනෙන මහතා සුධී,
මහන්තමෙප්‍ය'ක්කං නාගං
ඛාදන්ති පාණකා බහු.

භා. නුවණැත්තේ තමා එකලාව මහාජනයා හා විරුඩ නොවන්නේය. මහත්වූවත් උදකලාවූ ඇතු බොහෝ පණුවෝ (එකතුව) කත්.

143 සිනෙහං දස්සයන්තො'පි
අන්තො දුඨාසයො ඛලො,
බහි චාරුතරම්ප්‍ය'න්තො
ඛරං හි බදරීඵලං.

භා. දුර්ජනතෙමේ සොභාගය දක්වන්නේ නමුත් ඇතුලත දුෂ්ටවූ අදහස් ඇත්තේය. ඒ එසේමැයි. ඩෙබරගෙඩිය පිටත ඉතා සිත්කළු නමුත් ඇතුලත රළුවෙයි.

144 ආගන්තුකස්ස සක්කාරෙ
අමිත්තස්සා'පි කාරියො,
නො'පසංහරතෙ රුක්ඛො
ඡායං පස්සම්හි ඡින්දතො.

භා. සතුරුවූවත් අමුත්තාට සත්කාර කළයුතුය. වෘක්ෂය තෙම එය කපන තැනැත්තහු සිටින පැත්තේ සෙවන අකුළා නොගන්නේය.

145 ලබ්භෙස්සනො නිම්මලයතෙ
සබ්බථා සජ්ජනං ඛලො,
මද්දමානො යථා හත්ථො
හස්මනා සුට්ඨු දප්පණං.

භා. දුදනතෙමේ සත්පුරුෂයා මඩනේ හැමලෙසින්ම ඔහු නිර්මලබවට පමුණුවයි. කැඩපත අළුවෙන් මනාසේ මඩනාවූ අත එය පිරිසුදුබවට පමුණුවන්නාක් මෙනි.

146 අසාධුරේකො සකලං
ඛමො නාසයිතුං කුලං,
කිලෙසයති එකො'ව
නකාරො වණ්ණමාතිකං.

භා. එක අසත්පුරුෂයෙක් සම්පූර්ණ කුලයක් නසන්නට සමර්ථවෙයි. ඒ එසේමය. එකම න යන්න මුළු හෝඩිය කිළුටු කරයි.

147 කිං කරෙම? සචෙ විජ්ජා
හවෙදවිනයාවහා
ජනනී චෙ විසං දෙති
කො තස්ස පටිසෙධිතා?

භා. හික්මීම පිණිසම පවත්නාවූ ශාස්ත්‍රඥානය යමකුට නොහික්මීම ගෙණදෙයිනම් ඊට කුමක් කරමුද? වැදූ මවම දරුවාට වසදෙන්නීනම් එය වළක්වන්නේ කවරෙක්ද?

148 ජිගුච්ඡතෙ නා'හිරිකො
පාපකම්මං කුදාචන,
කිං ජිගුච්ඡති? දුග්ගන්ධ-
මමෙජ්ඣං ගාමසූකරො.

භා. ලජ්ජා නැත්තෙක් කිසිකලක පාපකර්මය පිළිකුල් නොකරයි. ගම් ඌරෙක් දුර්ගන්ධවූ අශුචිය පිළිකුල් කෙරේද? නැත.

149 ථොමයන්තො පරගුණං
විඛ්‍යාතිං යාති පණ්ඩිතො,
විකාසෙන්ති කුමුදිනිං
වඩ්ඪතෙ චන්දිකා භුසං.

භා. අනුන්ගේ ගුණය වර්ණනා කරන ප්‍රාඥතෙමේ ප්‍රසිද්ධියට පැමිණෙයි. කුමුදුවිල පොබයන සඳරැස අතිසයින් වැඩේ.

150 ඨත්වා සසමයෙ'වෙ'තං
නින්දන්තො දූසයතෙ සයං,
ජනතිං වණ්ණදූසී'ති
භණන්තො කො හි සුජ්ඣති?

භා. තමන්ගේ ආගමෙහිම සිටගෙණ එයට නින්දාකරන නැනැත්තේ තමාම කිළුටුවෙයි. වැදූ මෑණියන්ට වෙසඟනකැයි බණින්නාවූ කවරෙක් නම් තෙමේ පිරිසුදු වෙයිද?

151 අසුද්ධො වෙ සසමයො
සුද්ධං ඤත්වා භජන්තු තං,
විහාය සභයං මග්ගං
නිබ්භයං පථිකා යථා.

භා. තමන්ගේ ආගම අශුද්ධනම් ශුද්ධවූ ආගමක් දැන එය භජනාය කෙරෙත්වා. භය සහිතවූ මාර්ගය අත්හැර නිර්භය මාර්ගයක් සෙව්නා මගීන් මෙනි.

152 අධම්මචාරි ධම්මඤ්ඤූ
විනෙතුං කෙන සක්‍යතෙ?
න කෙනා'පි උපායෙන
මිච්ඡා සුත්තො පබුජ්ඣති.

භා. අධර්මයෙහි හැසිරෙන ධර්මඥතෙමේ (පව්කරමින් බණ දෙසන අය) කවරකු විසින් හික්මවියහැකිවේද? බොරුවට නිදගත්තෙක් මොන උපායකිනුත් නොපිබිදෙයි.

153 ධරන්තො නෙකසත්ථෙ'පි
අත්ථං බාලො න බුජ්ඣති,
භාරත්ත'මෙව ජානාති
චන්දනස්සා'පි ගද්‍රභො.

භා. අව්‍යුත්පන්න බාලතෙමේ නොයෙක් ශාස්ත්‍රයන් දරන්නේද ශාස්ත්‍රාර්ථය අවබොධ නොකරයි. හොටළුතෙමේ තමාපිට. පැටෙව් සඳුහශේත් බරබවම දනියි.

154 සුණමානො'පි සඬම්මං
දුප්පඤ්ඤො නා'වබුජ්ඣතෙ,
තික්‍ඛුජ්ජිතෙ සටෙ කිනනු
ආසිත්තං තිඨතෙ ජලං?

භා. අඥානතෙමේ බණ අසමිනුත් එය අවබොධ නොකරයි. යටිකුරු කරණලද කළයෙහි වත්කළ ජලය රඳුතිබේද? නොතිබේමය.

155 සුණෙය්‍ය සජ්ජනොවාදං
ඵරුසම්පි සමාහිතො,
කටුකම්පි හි භෙසජ්ජං
පීත්‍වා හොති නිරාමයො.

භා. සුදනන්ගේ අවවාදය රළුවුවත් සමාධිව අසන්නේය. බෙහෙත කුළුරසවුවත් එය බී නිරෙගී වන්නේමය.

156 කල්‍යාණමිත්තං සෙවෙථ
දස්සෙනන්තං වජ්ජ'මත්තනො.
පොථෙත්‍වා'පි නිධිඨානං
නයනෙතා සුභදෙ'ව හො!

භා. තමාගේ වරද පෙන්වාදෙන කල්‍යාණ මිත්‍රයා ඇසිරු කරන්නේය. භවත්නි! නිධානයක් තිබෙන තැනට තළතළා වත් ගෙණයන්නෝ යහළුවෙක්මය.

157 දාතබ්බං භුඤ්ජිතබ්බඤ්ච
සඤ්චයො හි නිරත්ථකො,
සඤ්චිතං ඡප්පදාතම්පි
මධු තෙසං කිමත්ථියං?

භා. තමා සතු ධනය දියයුතුයි කෑයුතුයි. නොදී නොකා රැස්කිරීම නිරර්ථකමය. මීමැස්සන් විසින් රැස්කරණ ලද්දවූද මීය ඔවුන්ට කවර ප්‍රයොජනයක් ගෙණ දෙන්නේද?

158 දළිද්දස්සෙ'ව දාතබ්බං
සම්ඩස්ස ධනෙන කිං?
රොගාතුරස්ස භෙසජ්ජං
හිතං නා'නාමයස්ස හො!

භා. දිළින්දුටම දියයුතුයි. පොහොසතාට ධනයෙන් ප්‍රයොජන කිම්ද? පින්වත්නි! ලෙඩාටම බෙහෙත පථ්‍යවෙයි. නිරොගියෙකුට පථ්‍යනොවේ.

159 විනා'පි ධීරෙ විත්තෙන
බහුමානුන්නතිං භජෙ,
අකිඤ්චනො'පි භො! සීහො
වහතෙ මහතිං ජුතිං.

භා. ප්‍රාඥතෙමේ ධනය නැතුවත් බහුමානය හා උසස්බැව් සෙව්නේය. භවත්නි! කිසිවක් නැත්තාවූද සිංහතෙමේ මහත්වූ ශොභාවක් උසුලයි.

160 මානීයතෙ න ලොකෙන
මහාභොගො'පි මච්ඡරී,
ධනකඞ්ඛනමාලො'පි
සුනඛො සුනඛො න කිං?

භා. මහාධනවත්වූද මසුරුතෙමේ ලෝවැස්සා විසින් බුහුමන් නොකරණු ලැබේ. පැළඳි රන්මාලයක් ඇතත් බලුතෙමේ බලුම නොවේද?

161 මහාගුණස්සා'පි සතො
නාසෙති ගුණ'මත්ථිතා,
යථා පියතරං රූපං
මලිනීකුරුතෙ ජරා.

භා. යාචක (ඉල්වන) බව මහගුණවතෙකුගේ වුවත් ගුණය නැතිකරයි. ජරාතොමෝ ඉතා ප්‍රියවූද රූපය යම්සේ කිළුටු කරන්නීද එමෙනි.

162 අගාරදීනවං දිස්වා
නික්ඛමන්ති විචක්ඛණා,
වනං දුමග්ගිනා'දිත්තං
හිත්වා යන්ති හි යූථපා.

භා. නුවණැත්තෝ ගිහිගෙහි වරද දැක නික්මයෙති. (පැවිදිවෙති.) ඒ එසේ මැයි. හස්තිරජයෝ ලැව්ගින්නෙන් ගිනිගත් වනය අත්හැර යෙති.

153 පරත්ථනිරතා හොන්ති
ධම්මතායෙ'ව සජ්ජනා,
වස්සතෙ සලිලං මෙඝො
මනුස්සෙහි නයාචිතො.

භා. සාධුජනයෝ තමන්ගේ ධර්මතාවෙන්ම පරවැඩ කිරීමෙහි ඇලුනාහු වෙති. මේඝයතොමෝ මිනිසුන් විසින් යාච්ඤා නොකරණ ලද්දේ ජලය වස්වයි.

164 මහබ්බලෙන කෙනා'පි
විවදෙථ න දුබ්බලො,
කො නාම පාදයුධෙන
ජෙතුං සක්කොති? වාරණං.

භා. තෙමේ දුර්වලව මහද්බල ඇති කිසිවකු සමග විවාද නොකරන්නේය. පයින් ගසා ගැණීමෙන් ඇතු පරදවන්නට කවරෙක් නම් සමර්ථවේද?

165 අඤ්ඤං හි භො! කායබලං
අඤ්ඤං ඤාණබලං භවෙ,
න සමෙන්ත්‍යං' සුමනෙතා'පි
කදචි සසිභානවො.

භා. භවත්නි! කායබලය නම් අනෙකක්මය. ඥානබලය අනෙකක් වන්නේය. රැස්තිබුණත් සඳහිරු දෙදෙන කිසි කලෙක සම නොවෙති.

166 ඛුද්දකම්පි සකං ඨානං
ලොකො මඤ්ඤති නිබ්භයං,
තිලෙ සකෙ ලටුකිකා
භවතෙ කාමලාපිනී.

භා. ලෝවැසිතෙම කුඩාවූද තමන්ගේ ස්ථානය නිර්භය තැනකැයි සිතයි. කැටකිරිල්ලතොමෝ සිය කැදෑල්ලෙහි කැමති සේ හඬන්නීවෙයි.

167 බලවම්හී'ති සප්පඤ්ඤො
න නයෙ වෙරිනං පරෙ,
තිකිච්ඡකො මම'ත්ථී'ති
කො විසං භුඤ්ජතෙ? සයං.

භා. ප්‍රාඥතෙමේ බලසම්පන්නයෙමියි අනුන් සතුරු බවට පමුණුවා නොගන්නේය. මට වෙදෙක් ඇත්තේයයි කියා කවරෙක් තෙමේ වසකන්නේද?

168 මහනොතායෙව මහතං
අත්ථං සාධෙන්ති නෙ'තරෙ,
විනාසමුද්දං කො අඤ්ඤො
වහතෙ? වලබානලං.

භා. මහත්හුම මහතුන්ගේ වැඩ සිදුකරත්. සෙස්සෝ සිදු කළ නොහෙත්. මහමුහුද විනා අන්කවරෙක් වඩබාග්නිය උසුලන්නේද?

169 එකො'ව නායකො සෙය්‍යො
බහවො තෙ විපත්තියා.
හිතාය රවිරෙකො'ව
සත්ත තෙ ලොකනාසකා.

භා. එකම නායකයෙක් උතුම්වේ. බොහෝවූ නායකයෝ විපත්පිණිස වෙති. එකම සූර්‍ය්‍යතෙමේ හිතපිණිසවෙයි. ඔව්හු සත්දෙනෙක් වූවාහු ලොවනසත්.

170 නාසෙතබ්බම්පි සප්පඤ්ඤා
වඩ්ඪෙන්ති රිපු'මෙකදා,
ගුළෙන වඩ්ඪිතො සෙම්හො
සුඛං පාතීයතෙ යථා.

භා. සමහරවිට නුවණැත්තෝ නැසියයුතු සතුරුද වැඩි දියුණු කරවති. යම්සේ උක්සකුරෙන් දියුණු කරණලද සෙම සුවසේ එළනුලැබේද එමෙනි.

171 උන්නතිං කුරුතෙයෙව
මහාජනසමාගමො,
භජෙ මුත්තාඵලසිරිං
සලිලං නලිනීදලෙ.

භා. මහාජනයා හා එක්වීම උසස්බවක් ඇතිකෙරේමය. නෙළුම්පතෙහි ජලයතෙම මුක්තාඵල (මුතුඇට) යක ශොභාව සෙව්නේය.

172 කිසෙ ජනෙ න කස්සා'පි
සොහජ්ජං විජ්ජතෙ භුවි,
වනදහෙ අග්ගිසඛා
දීපං නාසෙති මාළුතො.

භා. කෘශවූ ජනයාකෙරෙහි ලොව කවරකුගේවත් යහළු බවක් නැත. වනය දැවීමෙහි (බලවත්වූ) ගින්නට යහළුවන වාතයතෙමේ (දුර්වලවූ) පහන නිවයි.

173 සමත්ථො'පිහි තෙජස්සී
අසහායො කරෙය්‍ය කිං?
නිවාතෙ ජලිතො අග්ගි
නිබ්බාති සය'මෙව හො!

භා. තෙදඇති සමතෙක් වුවත් යහළුවකු නැතිව කුමක් කරන්නේද? භවත්නි! සුළං නැති තැන දල්වනලද ගින්න තොමෙම (ඉබේම) නිවෙයි.

174 නක්ඛමො හන්තු'මෙකාකෙ
දුබ්බලෙ බලවා අපි,
ගච්ඡෙ'ප්‍ය'නෙකසඞ්ඛ්‍යසංහතෙ
හන්තුං සක්කොති නා'නිලො.

භා. දුබලවුවද එකතුව සිටිනවුන් නසන්නට බලවතෙක් වත් සමර්ථ නොවන්නේය. වාතය තෙමේ එකිනෙක බැඳීසිටි කුඩා ගස් වුවත් නසන්නට නොහැකි වන්නේය.

175 නිරුද්ධෙ චෙතසි පරෙ
නිරුජ්ඣන්ති'න්ද්‍රියානි'පි,
මෙඝච්ඡන්නෙ දිනකරෙ
ඡාදිතායෙව රංසියො.

භා. සිත (මනින්ද්‍රියය) නිරුද්ධවූ කල්හි සෙසු (චක්ඛුරාදි පස්) ඉඳුරෝද නිරුද්ධවෙත්. හිරු වැසිවළාවෙන් වැසීගිය කල්හි රශ්මීහු වැසුනාහුම වෙති.

176 භාගධෙය්‍යන්ති චින්තෙන්තො
නච්චජෙ විරියං බුධො,
උය්‍යොගෙන විනා තෙලං
තිලානං නො'පජායතෙ.

භා. ප්‍රාඥතෙමේ පින්පව් දෙකමයයි සිතා වීර්‍ය්‍යය අත් නොහරින්නේය. වෑයමක් නැතුව තලවල තෙල් හටගන්නේ නැත.

177 රිතෙ පරක්කමා කිඤ්චි
න ඵලං කම්මුනො මතං,
කංසතාළො හි එකෙන
න සම්පජ්ජති පාණිනා.

භා. කර්මයාගේ කිසිම ඵලයක් වෑයම නැතිව සිද්ධනොවන්නේයයි දන්නාලදි. ඒ එසේමැයි. කසුතාළය ගැසීම එක අතකින් සිද්ධනොවේ.

178 අනුයාති කතං කම්මං
කත්තාරංයෙව නා'පරං,
සහස්සධෙනුමජ්ඣෙ'පි
වච්ඡො වින්දති මාතරං.

භා. කරණලද කර්මයතෙම එය කළතැනැත්තහුම කැටුව යෙයි. අනෙකකු කැටුව නොයෙයි. වසුපැටිතෙමේ දහසක් දෙනුන් මැදවත් තමාගේ මව සොයා ගණියි.

179 කම්මස්ස කත්තුනො වා'පි
සම්බන්ධො බලවා හවෙ,.
ඣායාතපානං සම්බන්ධං
කො විසුං කාතු'මීසතෙ?

භා. කර්මයාගේද කර්තෘහුගේද අන්‍යොන්‍යසම්බන්ධය බල වත් වන්නේය. ඒ එසේමැයි. සෙවනැල්ලය අව්වය යන දෙදෙනාගේ ඔවුනොවුන් අතර පවත්නා සම්බන්ධය වෙන් කරන්නට කවරෙක් පොහොසත්වේද?

180 සකිං දිස්වා'පි පුරිසං
බුජ්ඣනෙත සාරතං බුධා,
තුලයිත්වා'පි හණ්හන්ත
පමෙනති නිපුණා පලං.

භා. නුවණැත්තෝ පුරුෂයකු එක්වරක් දුටත් ඔහුගේ සරු නිසරුබව තේරුම් ගණිත්. දක්ෂයෝ අතින් කිරාත් පලම මෙපමණයයි දැනගණිත්.

181 තාව පීති භවෙ ලොකෙ
යාව දානං පදීයතෙ,
වච්ඡො ඛීරක්ඛයං දිස්වා
පරිච්චජති මාතරං.

භා. ලෙව්හි යම්තාක් දානය දෙනුලැබේද ඒ තාක්ම (දන් ලබනවුන්ගේ) ප්‍රීතිය ඇතිවන්නේය. වසුතෙමේ කිරිසිඳීම දුටු මැණියන් හැර යන්නේයි.

182 සමිද්ධෙනා'පි සාතත්තබ්බා
සහායා විඤ්ඤුනා සදා,
සමුද්දො පරිපුණ්ණො'පි
චන්දොදය'මපෙක්ඛතෙ.

භා. සමෘද්ධ (පොහොසත්) වූද නුවණැත්තහු විසින් සැම විටම යහළුවෝ ඇතිකරගතයුතුවෙත්. මුහුද පිරුණේ නමුත් සඳ උදාවීම බලාපොරොත්තුවෙයි.

183 විස්සාසො සබ්බසත්තානං
සබ්බසම්පත්ති මූලකො,
නා'නුයන්ති මිගා සීහං
යථා යූථපතිං ගජා.

භා. විශ්වාසය සියලු සත්වයන්ගේ සියලු සැපතට මූල්මන්නේය. ඇතුන් ඇත්රජු සැටූව යනුමෙන් සිව්පාවෝ සිරජහු සැටූව නොයෙති.

184 මහන්තා එකරූපා'ච
සම්පදාසවා' පදාසු ච,
උදයන්තො'ත්ථමෙන්තො'පි
රත්තවණ්ණො'ච භානුමා.

භා. මහත්වරු සැපත්හිද විපත්හිද එකම ස්වභාවය ඇත්තාහුවෙති. සූර්ය්‍යදිව්‍යරාජතෙමේ උදාවන්නේද අස්තයට යන්නේද රත්පැහැ ඇත්තේම වෙයි.

185 පරූපත්ථසුඛෙත'ත්ත-
නාසං න ගණයෙ ඛලො,
සිරොනාසෙ කබන්ධො හි
නච්චතෙ යුද්ධභූමියං.

භා. දුර්ජනතෙමේ අනුන්ට වන අවැඩ ගැණ සැපසිතීමෙන් තමාගේ හානිය ගණන් නොගණියි. ඒ එසේමය. යුද්ධභූමියෙහි අක්ෂෞහිණියක් සෙනඟ නැසුන කල්හි ඇතිවන කබන්ධශරීරය තෙමේ තමාගේ හිස සිඳිබව ගණන් නොගෙණ නටයි.

186 හන්තුං පරත්ථ'මධම්මො
සමත්ථො නහි සාධිතුං,
පාතෙතුං පාදපෙ වාතො
න වුඩාපයිතුං ඛමො.

භා. අධමතෙමේ පරාර්ථය නසන්නටමුත් සිදුකරන්නට සමර්ථ නොවේ. වාතය තෙම වෘක්ෂයන් බිඳහෙළන්නට මිස නැගුටුවන්නට පොහොසත් නොවෙයි.

187 නිරත්ථකං හි පණ්ඩිච්ච-
මඤ්ඤාතෙ විනියොජිතං,
අන්ධකාරපටිච්ඡන්නෙ
ඝටෙ දීපො යථා'හිතො.

භා. අයුතුතැන යොදනලද පණ්ඩිතකම නිෂ්ප්‍රයොජන වේමය. අඳුරෙන් වැසී තිබෙන කළයතුළ දල්වූ පහනමෙනි.

188 සක්කරෙය්‍යාථ පඨමං
දූජ්ජනං පුන සජ්ජනං,
මූඛධොවනතො පුබ්බෙ
පසත්ථං පායුධොවනං.

භා. පළමුකොට දුර්ජනයාට සත්කාර කරන්නේය. නැවත සජ්ජනයාට සත්කාර කරන්නේය. මුහුණ සේදීමට පළමුවෙන් ගුදය සේදීම ප්‍රශස්තයි.

189 ලද්ධොකාසො පරිත්තෙත
මහතා දුබ්භතෙ බලො,
අඞ්ගුලික්ඛිපතොකාසෙ
සීසං ඛිපති නාම සො.

භා. ටිකෙන්ලද අවසර ඇති දුර්ජනතෙමේ මහත්වූ දෙයකින් ද්‍රෝහ කරයි. හේතෙමේ ඇඟිල්ලක් රුවන්නට ලද අවකාශයෙහි හිස දමන්නේ නම්වේ.

190 උග්ඝොසනා'කතත්ථස්ස
මුඛරස්ස නිරත්ථිකා,
ලක්ඛං විරජ්ඣ ගජ්ජන්තො
චාපිකො කෙන පූජ්ජතෙ?

භා. වැඩක්නොකළ වාචාලයාගේ මුරගෑම නිෂ්ඵලයි. ඉලක්කය වරදවාගෙණ ගර්ජනාකරන දුනුවා තෙමේ කවරකු විසින් පුදනු ලැබේද?

191 අජානෙය්‍යො හි පුරිසො
යාව පොරිසදස්සනා,
තුලාධිරූළ්හො සුරියො
ජයත්‍ය'ම්බුධරේ'පි හො!

භා. පෞරුෂය (වික්‍රමය) දක්නාතුරු පුරුෂයෙක් ඇඳින ගත නොහැක්කේමය. භවත්නි! තුලාරාසට නැගුණ සූර්‍ය්‍යතෙම මෙඝයන්ද ජයගන්නේය.

192 අදස්සිතබලො බාළ්හං
පබලො'ප්‍ය'භි භූයතෙ,
අනොත්ථරුගතං අග්ගිං
ලඞ්ඝන්ති ජලිතං නතු.

භා. නොපෙන්වනලද ශක්තිය ඇති ඉතා ශක්තිමත් පුරුෂතෙමේ වුවත් මැඩපවත්වනු ලබයි. දරකඳ ඇතුළත තිබෙන ගින්න පැනයෙති. නමුත් දැල්වුන ගින්න පැනනොයත්.

193 රක්ඛිතබ්බො කුලෙජෙඨො
පුරිසො සකුලෙහි හො!
අරා වහන්ති න රථං
විනාසෙ චක්කනාභියා.

භා. භවත්නි! කුලයෙහි දෙටු පුරුෂතෙම ඒ කුලයෙහි වූවන් විසින් රක්‍ෂාගත යුත්තේය. සක්තෑබය (රෝදයේ බොස් ගෙඩිය) කැඩුනකල්හි දැවිහු (ගරාදි) රථය ගෙණ නොයත්.

124 දුබ්බලෙ ගුණවන්තො'පි
ඡාදෙති ගුණවත්තරෙ,
රත්තිං දිපසිඛා කන්ති
නො'දිතෙ සති භාකරෙ.

භා. ගුණවත්වූද දුර්වලයන් වඩා ගුණවත් තෙමේ වසාලයි රාත්‍රියෙහි පහන්සිළුකැළුම් තිබෙත්. ඉරඋදාවූකල්හි නැතිවෙත්.

195 ථොකෙනෙ'ව පසීදන්ති
කුජ්ඣන්ති ච පුථුජ්ජනා,
තුලායඩ්ඨි යථා යාති
ථොකෙනු'න්නති' මොනතිං.

භා. පෘථග්ජනයෝ විකෙන්ම පහදිත් විකෙන්මත් කිපෙත්. තරාදි දණ්ඩ විකෙන්ම ඉහළටත් පහළටත් යන්නාක් මෙනි.

196 කාරියස්ස විනාසෙ'පි
ධිරො නච්චජතෙ ධිතිං,
නිදාඝෙ සොසිතසරෙ-
පවුඩ්ඪතො'ව මහොදධි.

භා. ධිරපුරුෂතෙම කාර්‍ය්‍යයාගේ විපත්තියක් ඇතිකල්හිද ධෛර්‍ය්‍ය නොහරින්නේය. ඒ එසේමැයි. නියංසාය වියලවන ලද විල්ඇති කල්හිද මහමුහුද උදම්වූයේම වෙයි.

197 මහාසහායො බුද්ධො'පි
කාරියන්තං නිගච්ඡති,
සමාගම්ම මහානජ්ජා
සමුද්දං යාති කුන්නදී.

භා. කුඩා අයෙක් වුවත් මහතෙකුගේ සහාය ඇත්තේ කටයුත්තේ කෙළවරට පැමිණෙයි. කුඩාගංගාතොමෝ මහගඟ හා එක්ව මහමුහුද කරා යන්නීය.

198 තෙජවා තෙජවන්තෙසු
දූරට්ඨො'පි ගණ්හියතෙ,
පක්ඛවමො පක්ඛවතාපස්ස
තපනො දහනෙසු හි.

භා. තෙද ඇතියේ දූරසිටියේද තෙදඇත්තවුන් අතරෙහි ගණන්ගණුලැබේ. ඒ එසේමය. සූය්‍ර්‍යතෙම පඤ්චතාපය නම්වූ තපස සම්බන්ධවූ අග්නීන් අතුරෙන් පස්වන ගින්නයයි ගණිනු ලැබේ.

199 වෙයෙවා' පෙක්ඛතෙ විවා
භාගධෙය්‍යඤ්ච පොරිසං,
අදෙසදුඨෙ සඥතෙඨ
මහාකවිරපෙක්ඛතෙ.

භා. නුවණැත්තේ දෛවය පෞරුෂය යන දෙකම අපෙක්ෂාකරයි. ඒ එසේමය. මහාකවිතෙමේ දෙෂදූෂිතනොවූ ශබ්දය අර්ථය යන දෙකම බලන්නේය

200 රජ්ජත'මෙව තිස්සාය
පුජ්ජතං යාති පණ්ඩිතො,
න විනා මලයා'ඤ්ඤත්‍ර
ජායතෙ රත්තචන්දනං.

භා. පඬිවරතෙමේ රජකු ඇසුරුකොටම පූජ්‍යබවට පැමිණේ.මලයපර්වතය හැර අන්තැනක රත්සඳුන්රුක නොඋප දියි.

201 ගුණවා පුරිසුත්තමො භුවි
සුචිරෙනා'පි භවෙ සුදුල්ලභො,
ජනයන්ත්‍ය'පි ගාවියො සුතෙ
තිසභං නෙව පරිස්සයාභිභුං.

භා. ලෙව්හි ගුණවත්වූ උත්තම පුරුෂයෙක් බොහෝ කල කිනුත් නොලැබියහැකි වන්නේය. දෙනුන් වස්සන් වදන නමුත් සියලු උවදුරු මඩනාවූ මහාවෘෂභරාජයකු නොවදත්මය.

202 මහතො මහතී'ඝ.වික්කමො
භවතෙ නෙව කදාචි ඛුද්දකෙ,
තරවො විපුලෙ'ව භින්දතෙ
පවමානො න පහඤ්ජනො තිණෙ.

භා. මේ ලොකයෙහි මහතකුගේ වික්‍රමය මහතකු කෙරෙහි වේ. කිසිකලෙකත් අල්පයකු කෙරෙහි නොවේමය. සුලඟ හමන්නේ මහත්වූ වෘක්ෂයන්ම බිඳියි. තණකොළ නොබි දියි.

203 පටිවක්ඛති නෙව සජ්ජනො
සපමානාය'පි දුජ්ජනස්ස භො!
අනුහුඞ්කුරුතෙ ඝනධ්වනිං
න ච හෙරණ්ඩරුතානි කෙසරී.

භා. පින්වත්නි! සත්පුරුෂතෙම තමහට ශාපකරන්නාවූද දුදනාට පිළිතුරක් නොදෙන්නේය. ඒ එසේමැයි. කෙශරීසිංහ රජතෙම මෙඝශබ්දය අසා ඊට උත්තර වශයෙන් සිංහනාදකරයි සිවල්හඬට උත්තර නොදෙයි.

204 න හි බාලිසසොවීදෙ විද්ව
ක්වචි යොජෙය්‍ය' සරූපකම්මනි,
ධුරතවජිනියො පයොජිතා
අසරූපෙසු න තක්කරු සියුං.

භා. ප්‍රාඥතෙමේ මූඪයන් හා නුවණැත්තන් ඔවුන්ට සුදුසු නොවන කිසිකටයුත්තක නොයොදන්නේය. තරකැත්ත හා වැය එදෙකට නොසුදුසු වැඩෙහි යොදන ලද්දහු ඒ ඒ කටයුතු නොකරන්නාහුවෙත්.

205 අධමස්ස'භිවඩ්ඪතෙ යසො
මහතී සන්නිහිතා යද'පදා,
නනු කක්කටකා'පි ගබ්භිණී
භවතෙ? සාපදහෙතුයෙව භො!

භා. යම් කලෙක මහත් විපතක් ළංව තිබේ නම් එකල්හි අධමයාගේ යස්ස වෙසෙසින් වැඩෙයි. භවත්නි! කකුළුදෙනත් ඇයට විපත් පිණිසම ගැබිගන්නී නොවේද?

206 පරොපකාරාභිරතා නිතන්තං
භවන්ති සන්තො 'නුදයද්දචිත්තා,
සුරත්තතා කොකනදන'මෙහො!
නිසග්ගසිද්ධා හි මනුඤ්ඤරූපා.

භා. කරුණාවෙන් තෙත්වූ ළය ඇති සත්පුරුෂයෝ අත්‍යර්ථයෙන්ම පරොපකාරයෙහි ඇලුනාහු වෙත්. භවත්නි! රක්තපද්මයන්ගේ සිත්කළුවූ රත්පැහැ ඇතිබව ප්‍රකෘතියෙන් සිද්ධවූවක්මය.

207 කතුපකාරං සුචිරෙන සන්තො
සරන්ත්‍ය'සන්තො නහි තඞ්ඛණෙ'පි,
චිරම්පි තිට්ඨන්ති සිලාය ලෙඛා
ජලෙසු නස්සන්ති ඛණෙ'ව තස්මිං.

හා. සත්පුරුෂයෝ තමන්ට කළ උපකාරය බොහෝ කල කිනුත් සිහිකෙරෙති. අසත්පුරුෂයෝ එකෙණෙහිවත් සිහි නොකෙරෙත්මය. ගලෙහි කෙටූ ඉරි බොහෝකලක්වුවත් නොමැකී තිබෙත්. දියෙහි ඇඳි ඉරි එවේලෙහිම මැකීයෙත්.

208 සන්තො'දයන්ත මහතො'දයෙන
දිස්වා ඛලො'සූයති නිච්ච'මෙව,
දිස්වාන සොබ්භානු පභාසමානෙ
ඣාදෙති හි'ස්සාය සසඞ්කසූරෙ.

හා. දුර්ජනතෙමේ මහත්වූ අභිවෘද්ධියකින් වැඩෙන්නාවූ සත්පුරුෂයන් දැක නිතොරම ඊර්ෂ්‍යා කරයි. ඒ එසේමය. රාහු තෙමේ බබලන සඳහිරු දෙදෙනා දැක ඊර්ෂ්‍යාවෙන් වසයි.

209 පියං වදන්තො'පි හි දුජ්ජනො හො!
විස්සාසනීයො න ච කොචි ලොකෙ,
මූඛං භවෙ වෙදමනාභිසිත්තං
ඡින්දෙය්‍ය කිං නෙව ඛුරං සුධොතං?

හා. භවත්නි! ලෙව්හි කිසි දුදනෙක් ප්‍රියතෙපුල් කියන්නේ නමුත් විශ්වාස නොකටයුත්තේමය. ඉතා මුවහත් ඇති කරනැත්ත මුවාත අමා ඉසිනලද වුවත් නොසිඳින්නේද? සිඳින්නේමය.

210 සුවිජ්ජ 'මොචාදචචො'පි ධීරො
ගණ්හෙය්‍ය නීචම්හයතො'පි කාමං,
වජ්ජෙය්‍ය? දිස්වා මණි'මුත්තමං හි
කොනාම ධීමා'පි අමජ්ඣමජ්ඣෙ.

හා. ප්‍රාඥතෙමේ මනාවූ ශාස්ත්‍රයත් ඔවාතෙපුලත් හීන කුලිකයකු ගෙන් වුවත් ඒකාන්තයෙන්ම ගන්නේය. ඒ එසේ මැයි. කවර නම් නුවණැත්තෙක් අශුචි මැදවත් උතුම් මිණි රුවන දැක නොගෙණ හරින්නේද?

211 වදතියෙව සවෙ'පි න පුච්ඡිතො
පරහිතාභිරතො හිත'මෙව හො!
නනු විබොධයතෙ? න පි යාචිතො
කුමුදිනීකුල'මෙස නිසංකරො.

හා. පින්වත්නි! පරහිතයෙහි ඇළුන තැනැත්තේ නොවිචාරණ ලදුවත් හිතවූ දෙයක් කියන්නේමය. නෙල චන්ද්‍රතෙමේ යාච්ඤා නොකරණ ලදුවත් කුමුදුවිල් සමූහය පොබයන්නේ නොවේද?

212 අභිමතං පුරිසස්ස මනොරථා
නහි සමිජ්ඣන්ති කිඤ්චි විනා ධිතිං,
සය'මූපෙනති මූඛං හි කාදවතං
සයති නෙව මිගා'පි මිගාධිපෙ.

හා. පුරුෂයකුට අභිමතවූ කිසිවක් ඔහුගේ මනදෙළවූ පමණකින් ධෛර්‍ය්‍ය නැතිව සමෘඩ නොවේමය. ඒ එසේමැයි. මුවෝවත් සිංහරාජයා නිදාගත්කල තුමූම ඔහුගේ මූඛයට කිසි විටක නොයෙති.

213 න හි සම්ජ්ඣති භාග්‍යවසා'ඛිලං
අවිරියෙන ඵලං කුසලස්ස'පි,
වද කථං භුවි චක්කයුගං විනා
වජති? වාජියුතො'පිව සන්දනො.

හා. කුශලවිපාකය වුවත් සියල්ලම වීය්‍ර්‍යයක් නැතිව භාග්‍යවශයෙන් සමෘඩ නොවේමය. කියග! අසුන්යෙදුවාවූද රථය සක්සුවල නැතිව කෙසේ බිම ගමන්කරයිද?

214 තුවට'මෙව හි භිජ්ජති දුජ්ජනො
න පුන කොතචි හොති සුසන්ධියො,
තනු පභිජ්ජති? මත්තිකභාජනං
පුන ච හොති න කොතචි සන්ධියං.

හා. දුජ්න තෙමේ ඉක්මනින්ම බිඳෙයි. යළි කිසිවකුවිසින් සම්ගිකළ හැකිත් නොවේ. මැටිබඳුන බිඳෙන්නේත් බිඳුන පසු කවරකු විසිනුත් ගැළපිය නොහැක්කේත් නොවේද?

215 සුරුචිරම්පි හි දුජ්ජනභාසිතං
භවතියෙව සදා'පි භයාවහං,
නනු ච පුප්ඵ 'මකාලසුපුප්ඵිතං
භය'මිහා' වහතෙ රුචිරම්පි භො!

හා. දුදනාගේ තෙපුල ඉතා සිත්කළුවුවත් සැමකල්හි භය එලවන්නේම වෙයි. පිණැත්තෙනි! මේ ලෙව්හි නොකලට පිපුණාවූ මල සිත්කළුවූවත් භය එළවන්නේ නොවේද?

216 යදි භවති කිලෙසිතො විභාවී
අථපි න තස්ස විනාස'මෙති බුද්ධි,
න හි බලු දහනස්ස 'ධොකතස්ස
භවති සිඛා'පි අධොමුඛා කුහිඤ්චි.

භා. පඩිවරයෙක් ඉදින් (සතුරකුවිසින්) කෙලෙසන ලදුයේ නමුත් ඔහුගේ ප්‍රඥාව නැති නොවෙයි. ඒ එසේමය. ගින්න යටිකුරුකළත් ගිනිදැල්ල කිසි තැනක යටිකුරු නොවේ.

217 මහත ‘මිහ හි හාදිසො‘ව තෙජෙ
සමථ්‘මූපෙනති යහිං විගිතතෙජා,
සමුදයති පභඞ්කරෙ විසොභා
නනු නිඛිලා ‘පිව තාරකා‘භි’මෙනති?

භා. මේ ලෙව්හි මහතුන්ගේ තෙජස යමක් නිමිතිකොට තෙදනැත්තෝ සංසිඳීමට යෙත්ද එබඳුවේමය. හිරු උදාවන කල්හි සියලුම තාරකාවෝ ශොභාරහිතව අස්තයට යන්නාහු නොවෙත්ද?

218 පත‘මපි බලු සජ්ජනො විපත්‍යා
පුන‘පි සමුන්නති ‘මෙතියෙව භීයො,
පතති හි කරතො ච කන්දුකො හො!
ස පුන සමුප්පතතෙ සුසීඝ‘මෙව.

භා. සත්පුරුෂතෙමේ විපතකින් වැටෙන්නේ නමුත් ඒකාන්තයෙන්ම නැවත වඩාත් උසස්බවට පැමිණේමය. භවත්නි! පන්දුව අතින් වැටේමය. එය යළිත් ඉක්මනින්ම උඩටනැගෙයි.

219 පතති බලු බලො විපත්තියෙ‘ව
නහි පතිතො ස සමුන්නතිං පුනෙ‘ති,
නනු ච නහි සමුප්පතෙය්‍ය? කාමං
භුවි පතිතො පුන මත්තිකාය පිණ්ඩො.

භා. දුර්ජනතෙමේ ඒකාන්තයෙන් විපතකින් වැටේමය. හේතෙමේ වැටුනේ නැවත උසස්බවට නොපැමිණේමය. මැටි පිඩක් බිමවැටුනේ නැවත උඩට නොනැගෙන්නේම නොවේද?

220 වස‘මිධ ජනතං ජනො හි භීයො
නයති මුඛෙ බහුපිණ්ඩපූරණෙන,
නනු මුඛසුවිලෙපනෙන භොනෙතා!
මධුර ‘මලං මුරජෙ ධනිං කරෙති?

භා මේ ලෙව්හි ජනතෙමේ බොහෝසේම මුඛයෙහි බොහෝ බත්පිඩු පිරවීමෙන් (බොහොම කන්නට දීමෙන්) ජනයා වසයට පමුණුවා ගණියි. පිණැත්තෙනි! මිහිඟුබෙරය බෙරඇස සොඳින් බෙහෙත් ගැල්වීමෙන් ඉතා මිහිරි ශබ්දයක් කරන්නේ නොවේද?

221 ගුණවති ගුණවන්තායෙව නිච්චං රමන්ති
නහි ගුණවතී බාලා තොස 'මෙන්ති'ධ කෙචි,
කමලිනි 'මලිසංඝා 'මොද 'මාසාද්‍ය 'පෙන්ති
සුරභි'මපි විදන්තා නෙව භෙකො'කචාසා.

භා. ගුණවතා කෙරෙහි ගුණවත්හුම නිතොර ඇලෙත්. මේ ලෙව්හි අඥනවූ කවරහුවත් ගුණවතකු කෙරෙහි සතුටට නොපැමිණෙති. බමර සමූහයෝ ඇතයන නෙළුම් සුවඳ අසා නෙළුම්විලට පැමිණෙති. එහිම සිටින මැඩියෝ සුවඳවත් නොද නිත්මය.

222 සුනමති නමණීයෙ පණ්ඩිතො සජ්ජනො'ච
න හි නමති ජළො හො! දුජ්ජනො කස්සචා'පි,
නමති හි ඵලභාරී භුරුහො සබ්බථා'පි
නමති ඵලවිහීනං සුක්ඛකණ්ඩම්පි කිනනු?

භා. පිණැත්තෙනි! පණ්ඩිතවූ සත්පුරුෂතෙම නැමෙන්ට සුදුසු කරුණෙහි සුවසේ නැමෙයි. ජඩවූ දුර්ජනයෙක් කිසිවකටත් නොනැමෙයි. ඒ එසේමය. පලබර ඇති රුක හැමලෙසින්ම නැමෙයි. පලනැති වියලි දරලීයත් නැමේද? නැත.

223 තිපිටක'මපි සබ්බං උග්ගහෙත්වාන ධම්මං
න විජහති සභාවං පාපකං පාපකො හි,
ලවණුදධිනිවාසී තම්පිවන්තො'පි මීනො
නහි ලවණසරීරෙ නෙව ලොණත්ත'මස්ස.

භා. පව්වුතෙම පිටකත්‍රය ධර්මය සියල්ලම ඉගෙණත් පව්වූ ගතිය අතනොහරිමය. ලුණුදිය මුහුදෙහි වසන්නාවූද ඒ ලුණු දියම බොන්නාවූද මත්ස්‍යතෙම ලුණු සිරුරක් ඇත්තේද නොවෙයි. ඔහුගේ ලුණුරසබවකුත් නැත්තේමය.

224 සුජනගණවිහෙසී දුජ්ජනා නාස'මෙන්ති
සපරහිතරතා බො වුඩ්'මෙන්ති'හ සන්තො,
බහුතනයවතීනං සන්තතිං දීපිණීනං
කුල'මපිච ගවීනං පස්සථෙ' කත්‍රජීනං.

භා. මේ ලොකයෙහි සජ්ජනසමූහයා වෙහෙසවන දුදනෝ නැසීමටයෙත්. ස්වපරහිතයෙහි ඇලුනාවූ සත්පුරුෂයෝ අභිවෘඩියට පැමිණෙත්මය. බොහෝ දරුවන් වදන දිවිදෙනුන්ගේ සන්තතියත් එක දරුවකු වදන ගවදෙනුන්ගේ කුලයත් බලව්.

225 සම්භයසමුප්පජ්ජතා සම්පදවා'පදවා
නභවති භූමි හොනෙතා! වාරණීයා කදාචි,
විකසන 'මුද්දිතෙ සම්භොච'මප්ප'හ'මෙනෙත
දස්සනකිරණෙ කො වාරයෙ? නීරජනං.

හා. පින්වත්නි! ලෙව්හි කලට උපන් සැපත හෝ විපත හෝ කිසිලෙසකින් නොවැළැක්විය හැකිය. ඒ එසේමය. හිරු උදවන කල්හි පද්මයන්ගේ පුබුදුවීම නම්වූ සැපතත් ඉරබස්නා කල්හි හැකිළීම නම්වූ විපතත් කවරෙක් වළක්වන්නේද?

226 සන්තො'සතො වසගතො සමුපෙති නාසං
යො සො'ච සාධුවසගො ලසතෙ සුදීඝං,
සන්තාපිතායසි ජලං විලයං පයාති
මුත්තානිභං විලසතෙ නලිනීදලට්ඨං.

හා. යම් සත්වයෙක් අසත්පුරුෂයාගේ වසයට ගියේ විනාශයට පැමිණෙයිද ඒ තෙමේම සත්පුරුෂයාගේ වසයට ගියේ දීඝීකාලයක් බබලයි. රත්කළ යවටෙහි ජලය වියලීමට යෙයි. නෙළුම්පතෙහි සිටි දිය මුතුඇටයක් මෙන් බබලයි.

227 සාධූහි නිච්චභජිතා'පිහි දුජ්ජනා හො!
පොරාණකං න විජහන්ති ගතිං කදාචි,
රජ්ජූහි බද්ධ'මපි ධූපිත'මග්ගිනා'පි
වඞ්කං ජහාති න කදාචි සුණස්ස පුච්ඡං.

හා. පිණැත්තෙනි! සත්පුරුෂයන් විසින් නිතොර සෙව්නාලද්දවූද දුදනෝ පැරණි දුදන ගතිය කිසිසේත් නොහරිත්. බලුගේ නගුට රැහැණෙන් බැන්දත් ගින්නෙන් තැව්වත් කිසි කාලක ඇදය නොහරියි.

228 සම්පත්තියං භජති සෙවයතෙ ච බාලො
අඡෙද්දඤ සගොත්තජනතඤ්ච විපත්තිකාලෙ,
පඞ්කෙරුහං විලසතෙ සහ ඡප්පදෙහි
තං සුස්සතො'පි ච සහො'දකනීලිකාහි.

හා. අඥානතෙම සැපතක් ඇතිවිට පිටඋදව්ය ඇසිරු කරයි. විපත්කලට නෑදෑයින් සෙව්නේවෙයි. ඒ එසේමය. නෙළුම්මල බමරුන් සමග බබලයි. වතුරත් දියසෙවෙලුත් සමග වියලෙයි.

229 සන්තො'පි සග්ගුණරතා බලු දුජ්ජනානං
සංසග්ගතො සමුපයන්ති විනාස'මෙකෙ,
අබ්භන්තමාවුතතයා පන කාළපක්ඛෙ
ඡෙයො සමො'පි විසමො විය ඛායතෙ'ව

භා. සද්ගුණයෙහි ඇලුනාවූ ඇතැම් සත්පුරුෂයෝ පවා දුදනන්ගේ එක්වීමෙන් එකාන්තයෙන් විනාසට පැමිණෙත්. කළුවර පක්ෂයෙහි ගනඳුරෙන් වැසීගිය බැවින් සමවූ මාගීයත් විෂමයක් මෙන් වැටහේමය.

230 කාමං ජහාති නහි ජාතු විපත්තියම්පි
සම්භන්තසාදිස'මතො ම්ඨිතිං සුධීරො,
මත්තෙභකුම්භදලනාභිරතො මිගින්දො
භුඤ්ජෙය්‍ය කිං? තිණ'මසූනි'පි සඤ්චජන්තො.

භා. ප්‍රාඥතෙමේ විපතක් පැමිණියත් කිසිකලෙකත් දෘඪ මිත්‍රයකු බඳුවූ උතුම් ධෛර්‍ය්‍යය එකාන්තයෙන්ම අත්නොහ රියි. මදතුන්ගේ කුඹුපැළීමෙහි නියැලි කෙශරීසිංහරාජතෙම දිවිනැසෙතත් තණකොළ බුදින්නේද? නැත.

231 යා කාචි යස්ස පකතී'ධ ජනස්ස හොති
නෙව'ස්ස සා භවති කෙනචි වාරණීයා,
සුවාණං කවෙ'පි ජනතා'ධිපතිං කරෙය්‍ය
සො නෙව ඛාදති තදු'පි උපාහනෙ කිං?

භා. මේ ලෙව්හි යමකුගේ යම් සවභාවයෙක්වේද ඔහුගේ එය කිසිවකු විසින් වැළැක්විය හැකි නොවෙයි. ඉදින් මහාජන සමූහය බල්ලකු රජබවට පත්කෙළේ නම් එකල්හිත් ඒ තෙමේ වහන් නොමකයිද?

232 දෙසං ගවෙසයති හෙ'ස පරෙස'මෙව
ලොකො'ණුමත්ත'මපි න'ත්තනියං පහූතං,
දූරෑති වඩ්ඪකරභිතානි කරොන්තියා'පි
වඩ්ඪකං තතො'ධිකතරං නනු? මාසියා භො!

භා. මේ ලෝවැසිතෙම අල්පමාත්‍රවූද අනුන්ගේම වරද සොයයි. බොහෝවූද තමන්ගේ වරද නොසොයයි. භවත්නි! ලී ඇද හරින්නාවූද වෑයේ තිබෙන ඇදය ඒ ලීවල ඇදයටත් වැඩි තරම් නොවේද?

233 ධීමා සුවිස්සුතයසො'ඛිලසත්ථවෙදී
නෙවා'භිමානවසගො භවතෙ කදාචි,
පීත්වා'පි සාදු සහකාරරසම්පණීතං
මඤ්ජුස්සරස්ස භවතෙ න මදො පිකස්ස.

භා. සකලශාස්ත්‍රඥවූ කීර්තිමත් පඬිවරයෙක් කවරකලෙක අභිමානයට වසඟ නොවේමය. මිහිරි කටහඬ ඇති කොවුල් පක්ෂියාට අනුපනිකරවූ මිහිරි මීඅඹරසය පානයකොටත් මත්වීමක් නොවේ.

234 බාලො හි දුම්මතිරඨිතපරිත්තසත්‍ථො
හොතේ'ව මානධනියො'සමි'ති සබ්බවේදී,
පිත්‍වා සකද්දමජලං ලුලිතම්පි භෙකො
ගබ්බාහතො බකබකායති සබ්බරත්තිං.

භා. මදනුවණැති අඥනතෙමේ වනාහි උගත් ස්වල්ප ශාස්ත්‍රයක් ඇත්තේ සියල්ල දන්නෙමැයි අභිමානය ධනයකොට ඇත්තෙක් වේමය. ඒ එසේමැනො. මැඩිතෙමේ කැලඹුනාවූ මඩසහිත දියත්තක් බීගෙණ ගර්වයෙන් මඩනාලද සිතැතිව රෑය මුළුල්ලෙහිම "බකබක" යයි කෑගසයි.

235 අඩා'ය'මච්චයති කාරියසිඩ්ඩිහෙතු
ලොකො සදා පහුජනං නව භත්තියා'ම,
බීරත්‍ථිකො හි පුරිසො තිජම න්දිරසම්ං
පොසෙති ගාවි 'මවිරං නව ධම්මතාය.

භා. මේ ලෝවැසිතෙම එකාන්තයෙන්ම තම කටයුතු සිද්ධ කරගැණීම පිණිස සැමකල්හි ප්‍රභුජනයාට පුදපඬුරුදෙයි. භක්තියක් හෙයින්ම නොවේ. ඒ එසේමය. කිරිගණු කැමති පුරුෂතෙමේ ටිකදවසක් එළදෙන තම ගෙයිම බැඳගෙණ පොෂ්‍ය කරයි. ඒ ස්වභාව ධර්මයක් හෙයින් නොවේ.

236 විවජ්ජෙන්ති සංසග්ගතො තිග්ගුණානං
න වෙ කිඤ්චි සන්තො සභාවං විභාවී,
පිකා කාකසංසග්ගතො වා'පි නෙව
විවජ්ජෙන්ති මඤ්ජුස්සරත්තං කදාචි.

භා. සත්පුරුෂවූ ප්‍රාඥයෝ එකාන්තයෙන් නිර්ගුණයන් ඇසුරු කිරීමෙන් කිසි ප්‍රකෘතියක් අතනොහරිත්. කොවුලෝ කවුඩන් හා සංසර්ගය හෙතුකොටගෙණත් කිසිකලක මධුරස්වර ඇතිබව නොහරිත්මය. .

237 නරං උත්තමං සත්තමං කඤ්චිදෙව
චිරං පීළයන්තී'හ නෙවා 'පදයො,
. ඛණංයෙව විච්ඡාදයෙ රාහු චන්දං
නිසෙධෙතු 'මීසො න සො සබ්බදා තං.

භා. මේ ලෙව්හි විපතින්හු ඉතා සත්පුරුෂවූ කිසිම උතුම් මනුෂ්‍යයකු වැඩිකලක් නොපෙළත්මය. රාහුතෙමේ මඳවෙලා වක්ම සඳ වසාදමයි. යෙතෙම සැමදම ඒ සඳ වළක්වන්නට සමර්ථනොවේ.

238 පියම්භාසතෙ යො හි පච්චක්ඛතො
විනාසෙති අත්ථං පරොක්ඛෙ වජෙ'තං,
මුඛෙ ඛීරලිත්තං විසෙනා'භිපුණ්ණං
ඝටං කොහි ගණ්හෙය්‍ය? ධීමා මූධා'පි.

භා. යමෙක් ඉදිරියට පැමිණියේ ප්‍රියවචන කථාකරයිද අසම්මුඛයෙහි වැඩ නැතිකරයිද ඒ මිතුරා අත්හරුව. මුවවිට කිරිගල්වන ලද්දවූ ඇතුළ වසපිරවූ කළය කවරනම් නුවණැත් තෙක් නොමිලේවත් ගන්නේද?

239 කථං දළ්හමිත්තාන විස්සාසිකානං
භවෙ? වඤ්චනං විඤ්ඤුතා මානවස්ස,
සපුත්තං වධිත්ව'ඛක 'මාරුය්හ සුත්තං
භවෙය්‍ය'ස්ස තං කින්නු? පොරිසස්ස 'මමෙහා!

භා. තමන් විශ්වාසකරන දෘඪ මිතුරන් රැවටීම කෙසේ නම් මනුෂ්‍යයකුගේ පණ්ඩිතකමක් වන්නේද? භවත්නි! ඇත සට නැග නිදාගත්තාවූ තම පුතු මරා එය ඔහුගේ කිනම් පරාක්‍රම යෙක් වන්නේද?

240 කරොන්තො'ප්‍ය 'නිට්ඨානි යො යස්ස කොචි
පියො සො පියො තස්ස හොතෙ'ව කාමං,
ඩහන්තො සදෙහං සගෙහම්පි කින්නු?
භවෙය්‍ය'ප්පියො ජාතවෙදෙ ජනස්ස.

භා. අනිටුදේ කරන්නාවූද යම්කිසිවෙක් යමකුට එකාන්ත යෙන් ප්‍රියවේ නම් හෙතෙම ප්‍රියවේමය. තමන්ගේ සිරුරත් ගෙයත් දවන්නාවූද ගින්න මහජනයාට අප්‍රියවන්නේද? නැත.

241 සුධීරෙ'පි ලොකෙ විනා වීතරාගං
න වෙ සොකවෙගං සහෙ කොචි ජන්තු,
පදිත්තග්ගිතත්තං හි කාලායසම්පි
භජෙ මද්දවං ථද්ධභාවං විහාය.

භා. ලෙව්හි රහතුන්වහන්සේ නමක් හැර ඉතා ධෛර්‍ය්‍ය වත්වූද කිසිසත්ත්වයෙක් ශොකවෙගය නොඉවසන්නේය. ඒඑසේ මැයි. දැල්වුන ගින්නෙන් රත්වූ යකඩය පවා තදබව හැර මොළොක්බව සෙව්නේයි.

242 න සන්ධිසම්භත්තතා සන්ථුතා වා
සතං යුජ්ජතෙ දුජ්ජනෙනෙ'හ කාචි,
ජලන්තො ඹහත්‍යා'දියන්තස්ස හත්ථං
කිලෙසෙති සන්තො'පි අඞ්ගාරකො හි.

භා. මේ ලෙව්හි සත්පුරුෂයන්ට දුදනකු හා සමග කිසිම සන්දෘෂ්ටසම්භක්ත බවක් හෝ සතුරු බවක් හෝ යුතුනොවන්නේය. ඒ එසේමැයි. දිලෙන ගිනි අඟුර ගන්නහුගේ අත දවයි. නිවුණ අඟුරද ගන්නහුගේ අත කිළුටු කරවයි.

243 විජානාති ධම්මං විජානාති සත්ථං
නබො විජ්ජතෙ ඨාන'මෙතං බලස්ස,
යථා ඛීරසෙකෙන සංවඩ්ඪිතො'පි
න තිත්තං ජහාතෙ'ව නිම්බො කදාචි.

භා. ධර්මය දනියි ශාස්ත්‍රය දනියියත මේ කරුණ දූර්ජනයාට නැත්තේමය. කිරි වත්කිරීමෙන් වැඩුවාවූද කොසඹරුක කිසිකලක තිත්තරස නොමහරින්නාක්මෙනි.

244 භුසං බද්ධවෙරස්ස සබ්බා'පි සබ්භි
භවන්ත්‍යා 'පදායො සදෙව'න්තිකාථා,
සුමත්තො මහාසෙල 'මාසජ්ජ දන්තී
විපත්තිං හවෙ භින්නදන්තො පයාති.

භා. සත්පුරුෂයන් හා තදින් බැඳි වෛරඇත්තහුට සැම දුම සැමවිපත්ම ළංවසිටිත්. ඉතා මත්වූ හස්තිතෙම මහගල් පර්වතයකට ඇන බිඳුන දෙදළ ඇත්තේ එකාන්තයෙන් විපතට පැමිණෙයි.

245 ජනො සජ්ජනෙ දුජ්ජනොපද්දවෙහි
පසීදෙය්‍ය දිස්වා 'සමං ඛන්ති'මස්ස,
යථා මග්ගිකො සෙල 'මාරුය්හ තස්ස
නරෙ පත්ථදෙසෙ චිරං විස්සමෙය්‍ය.

භා. ලෝවැසිතෙම දුදනන්ගේ උවදුරු හෙතුකොටගෙණ සත්පුරුෂයාගේ අසදෘශවූ ක්ෂාන්තිය දැක සත්පුරුෂයා කෙරෙහි පහදින්නේය. කුමක්මෙන්දයත්? මගීපුරුෂයෙක් පර්වතයකට නැග ඒ පර්වතයාගේ සම ප්‍රදෙශයෙහි බොහෝ වෙලාවක් විඩාහරින්නාක් මෙනි.

246 ගුණං වා'ගුණං භො! විජානාති විඤ්ඤූ
නවෙ බාලිසො තං විජානාති කිඤ්චි,
සුවො පඤ්ජරත්ථො සුබං මඤ්ජුවාණී
වදතෙය්‍ය'ව ගාථං න කාකො කදාචි.

භා. භවත්නි! නුවණැත්තෙක් ගුණය හෝ අගුණය දැන ගණියි. ඒ ගුණාගුණ කිසිවක් අඥානතෙම නොදනීමය. මැදිරියෙහි සිටින මිහිරි තෙපුල් ඇති සුවපොතකතෙම සැපසේ ගාථාවක් කියාමය. කව්ඩෙක් කිසිකලක නොකියයි.

247 යහිං නත්ථි විසඤ්ඤූ ජනො කොචි දෙසෙ
තහිං පණ්ඩිතො බාලිසො වා'පි හොති,
න යස්මිං මහාපාදපා සාරවන්තො
දුමායන්ති හෙ'රණ්ඩගච්ඡා'පි තත්‍ථ.

භා. යම් පෙදෙසක නුවණැති අයෙක් නැත්තේනම් එහි අඥානයාත් පණ්ඩිතයෙක් වෙයි. ඒ එසේමය. යම් පෙදෙසක අරටු ඇති මහාවෘක්ෂයෝ නැත්තාහු නම් එහි එරඬුගසුත් වෘක්ෂ යහයි සලකනු ලැබෙත්.

248 ධනී! පණ්ඩිතෙ මා'වමඤ්ඤි ත්‍වං විසඤ්ඤූ
න තෙ වො සිරී රුක්ඛතෙ බින්දුමත්තා,
පභින්නාන'මමෙහා! නවෙ වාරණානං
භවෙ වාරණං තන්තමත්තං ලූතානං.

භා. එම්බා ධනවතුනි! නුවණැති පඬිවරුන්ට අවමන් නොකරව්. තොපගේ අල්පමාත්‍රවූ ඓශ්වර්‍ය්‍යය ඒ පඬිවරුන් නොවළක්වයි. මකුළුවන්ගේ හුයක් ත්‍රිමදගලිතහස්තිරාජයන් නවත්වන්නේ නොවේමය.

249 අදෙසො හි දුඃඛස්ස පාසංසියො භො!
අද්දෙසං පදුට්ඨෙ කරොන්තා'ව සන්තො,
නරො නො හි? දට්ඨො සුවාණෙන පාදෙ
ධසෙය්‍ය'ස්ස පාදං තිරුම්මත්තරූපො.

භා. භවත්නි! දුෂ්ටයාට වෛෂනොකිරීමම ප්‍රශස්තයි. වරදකළ අයකෙරෙහි සත්පුරුෂයෝ මෛත්‍රිය කෙරෙත්මය. උමතුගතියක් නැති කවර නම් මනුෂ්‍යයෙක් බල්ලකු විසින් පය සපාකන ලද්දේ පෙරළා ඔහුගේ පය සපාකන්නේද?

250 න බො බුඩ්ඪිමා සඞ්ඛනීයො සුසූ'ති
වයො නෙව ඨානං ධියා තෙජසො වා
නනු කිං? කෙසරී සෙකවසෙසා'පි ජාත්‍යා
පතත්‍යෙ'ව කුම්භෙසු මත්තාවිපානනන්ති.

භා. නුවණැති පුරුෂතෙම ළදරුවෙකැයි සැකනොකට යුත්තේමය. ප්‍රඥවටවත් තෙජසටවත් වයස කරුණක් නොවේමය. වයසින් එක්හැවිරිදිවූත් කෙශරීසිංහරාජතෙමේ මත්ත හස්තීන්ගේ කුම්භස්ථලයන්හි නොම හෙන්නේද?හෙන්නේමැයි.

ඉති භදන්තපණ්ඩිතෙන

විදුරුපොලපියතිස්සමහානායකත්ථෙරපාදෙන විරචිතා

දිට්ඨන්තරතනාවලී

සමත්තා.

අථ ගන්ථකත්තු සන්දස්සනා.

1 ලඞ්කාය රොහණෙ රම්මෙ සුප්පතිට්ඨිතසාසනෙ,
මජ්ඣෙ **ඌව** රට්ඨස්ස නිගමෙ සාධුසම්මතෙ.

2 **විදූරුපොල** විඛ්‍යාතෙ **වීරවත්තනී**'ති විස්සුතෙ,
ජාතො වෙස්සකුලෙ ධීමා නාමෙන **සිරිවඩ්ඪනො.**

3 ජාතියා දසවස්සො'ව පබ්බජිත්වා 'නගාරියං,
ගරූහි **පියතිස්සො**'ති දත්තාධිවචනො'සි යො.

4 යස්සු'පජ්ඣායකො ආසි තථා පාචරියො'පි ච,
රතනජොති විඛ්‍යාතො මහාථෙරො සගොත්තජෙ.

5 සිස්සස්සෙසු දුතියො තස්ස සඞ්ඝපතිස්ස තු,
යස්සා 'චෙරො'සි **අමිත-සාර**ව්හො ථෙරපුඞ්ගවො.

6 පරිවෙණම්හි **පරම-ධම්මචෙතිය** විස්සුතං,
අජ්ඣාවුත්ථො දයාවාසො සිස්සසංඝනිසෙවිතො.

7 **ධම්මානන්ද** මහාථෙරො ස්‍යාමවංසධජොපමො,
යං සික්ඛාපෙසි පාචීන-භාසාසත්ථෙසු බුද්ධිමා.

8 යො සත්තරසවස්සො'ව **දිට්ඨන්තසතකං** පුරා,
කතං කුසුමදෙවෙන ව්‍යාඛ්‍යාසි සකභාසතො.

9 යො ච'ට්ඨාරසවස්සො'ව ගාථාවීසසතං අකා,
තන්තිභාසාය **සුගතා-ලඞ්කාරං** පජ්ජබන්ධනං.

10 පුණ්ණවීසතිවස්සො යො පත්ථයන්තො'පසම්පදං,
රචයී **සාසනවංසං** ගාථාසට්ඨිසතන්විතං.

11 සිරිපවරාදිවජිර-ඤාණාලඞ්කාර විස්සුතං,
යස්සා'දාසි මහාසංඝො පසන්නො නාමසම්මුතිං.

12 යො ච පාචීනභාසාසු ජාතියා තිංසවස්සිකො,
පාචීනභාසොපකාර-සමාජෙන මහාමති.

13 පරික්ඛිතෙසු ලඞ්කාය-මාදිතො'විධ භික්ඛුසු,
පණ්ඩිතට්ඨානයොග්ගෙසු පූජනීයතමො අහු.

14 යො පණ්ඩිතාධිකාරඤ්ච සොණ්ණලඤ්ඡනසංයුතං,
දත්වා ලඞ්කිස්සරෙනා'සි පඨමං බහුමානිතො.

15 තථා'මරපුරඛ්‍යාතෙ නිකායෙ 'පුඩරට්ඨිකෙ
යො මහානායකධුරං පසත්ථං සඞ්ඝතො ලභි.

16 පඤ්චතිංසතිමෙ වස්සෙ ජාතියා පීතිවඩ්ඪනං,
මහාකස්සපථෙරස්ස චරිතං රචයිත්ථ යො.

17 භදන්තපණ්ඩිතො සො'යං **පියතිස්සො** මහාකවි,
ථෙරො පිරගුණාවාසො පරත්ථනිරතාසයො.

18 අනිට්ඨිතං පුරාරද්ධං භාවත්ථානුගතම්පුන,
අඩ්ඪතෙය්‍යෙහි ගාථානං සතෙහි පතිමණ්ඩිතං.

19 රතනොපමිතානෙක-දිට්ඨන්ත සමලඞ්කතං,
නිට්ඨාපෙසි ඉමඤ්චා'පි **දිට්ඨන්තරතනාවලිං.**

20 ගහෙත්වා සාදරං කණ්ණෙ පිළන්ධයථ භාතරො!
රතනාවලි 'මෙතං මෙ යතනෙන කතං මුදා'ති.